# ජාතික වැවිලි කලමනාකරණ ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2012

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත
අතුරුගිරිය
දුරකථනය : 011-2770232
ෆැක්ස් : 011-4547644
විද්‍යුත් තැපෑල : nipm@sltnet.lk
වෙබ් අඩවිය : www.nipm.gov.lk

# පටුන

## පරිපාලනවාර්තාව


| | පිටුව |
|---|---|
| දැක්ම | 01 |
| මෙහෙවර | 01 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 02 |
| අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය | 03 - 04 |
| ආයතනයේ අරමුණු | 05 - 06 |
| පාලක මණ්ඩලයෙහි සංයුතිය | 06 - 08 |
| විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් | 09 |
| ආයතන ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් | 09 - 10 |
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් | 10 |
| ආයතනයේ කාර්ය මණ්ඩලය | 11 - 12 |
| ආයතනයේ සංවිධාන ව්‍යුහය | 13 |
| පුහුණු අංශය | 14 - 31 |
| පරිපාලන අංශය | 32 - 34 |
| ගිණුම් අංශය | 34 - 35 |
| පසු ගිය වසරට සාපේක්ෂ ප්‍රගතිය | 35 - 36 |
| මුහුණ පෑ ගැටලු | 37 - 38 |
| නිගමන | 39 - 40 |

## දැක්ම

වැවිලි කළමනාකරණය පිලිබඳ පුහුණුව හා උපදෙස් සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ඨ ආයතනය බවට පත්වීම

## මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුලින් වැවිලි කර්මාන්තයේ සියළුම මානව වත්කම්හි වෘත්තිය නිපුනතාවය පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම.

# <u>සභාපතිතුමාගේ පණිවිඩය</u>

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙහි 2012 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි.

සලකා බලන වර්ෂය තුල තේ, රබර්, පොල් යන ප්‍රධාන බෝගයන්ගෙන් 70% ඉක්මවා දායකත්වයක් ලබා දෙන කුඩා වතු හිමියන් වෙනුවෙන් සලකා බලනු ලබන වර්ෂයේ අපගේ සේවාවන් ලබා දීමට අවධානය යොමු කරන ලදි.

මුළු වැඩ සටහන් වලින් 75.5% ක ප්‍රමාණයක් මෙම අංශය වෙනුවෙන් පවත්වන ලද අතර උක් සහ කජු වැනි අනෙකුත් වැවිලි නිෂ්පාදකයින් උදෙසාද අපගේ සේවය ලබා දෙන ලදි.

එසේම අපගේ සේවාවන් ලබා ගන්නා පාර්ශවයන්ට වඩා හොඳ සේවාවක් ලබා දීමේ අරමුණෙන් පරිගණක මධ්‍යස්ථානයක් ද ස්ථාපිත කරන ලදි.

තවද අප විසින් සේවාවන් සපයනු ලබන පාර්ශවයන්ට විශිෂ්ඨ සේවාවක් සැපයීමේ අරමුණෙන් අපගේ කාර්යය මණ්ඩලය සඳහාද ආයතනය තුල පුහුණු වැඩ සටහන් පැවැත්වීම ආරම්භ කරන ලදි.

ඊට අමතරව පවත්වනු ලැබූ මුළු වැඩ සටහන් ප්‍රමාණය 139.4% දක්වා ඉහල නැංවීමට සමත් වූ අතර ඒ තුලින් පුද්ගලයින් 8196 ක් රුපියල් මිලියන 4.9 ක් වැය කොට පුහුණු කරන ලදි.

ඊළඟ වර්ෂයේ අපගේ සේවාවන් වැඩි දියුණු කිරීමේ අරමුණෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හඳුන්වා දීමටද සැලසුම් කොට ඇත.

අප ආයතනයේ දේපළ වලින් අක්කර 05 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා යුද හමුදාවට භාරදුන් අතර ඒ සඳහා රාජ්‍ය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වටිනාකම ලැබෙතැයි බලාපොරොත්තුවෙන් සිටිමු. එය ලබා ගැනීමට අදාල අයදුම් කිරීමේ කටයුතු දැනට සිදු වෙමින් පවතී.

අඛණ්ඩව අපගේ සේවාව ලබා ගන්නා පාර්ශවයන්ට මෙන්ම නොයෙකුත් ආකාරයෙන් අපගේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් අයට මාගේ කෘතඥතාව පලකර සිටිමි.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිදුන්, එම අමාත්‍යාංශයේ ලේකම්තුමිය සුධර්මා කරුණාරත්න මැතිණිය ඇතුළු අනෙකුත් අමාත්‍යාංශයේ නිලධාරීන්, අමාත්‍යාංශයේ ඇති අනෙකුත් සංවිධාන සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් ලබා දුන් සහයෝගය සහ මඟපෙන්වීම ආයතනයේ කළමනාකරණයට මහත් පහසුවක් වූ අතර ඒ පිළිබඳව සිහිපත් නොකලහොත් එය බලවත් අඩුපාඩුවකි.

අවසාන වශයෙන් ආයතනයේ සියලුම කාර්යය මණ්ඩලයට ඔවුන් විසින් අපගේ අරමුණු ලඟා කර ගැනීම සඳහා ලබා දුන් සහයෝගයට ස්තූතිය පුද කර සිටිමි.

රංජිත් සමරසිංහ
සභාපති

# අධ්‍යක්ෂගේ පණිවිඩය

2012 වර්ෂයේදී ආයතනයේ පුහුණු කිරීම් සහ ඒ ආශ්‍රිත කටයුතු වල සතුටුදායක වර්ධනයක් දක්නටලැබේ. 2011 වර්ෂයේදී පැවැත්වූ මුළු වැඩසටහන් ප්‍රමාණය 104 ක් වූ අතර එය 139.4% කවර්ධනයක් පෙන්නුම් කරමින් 249 දක්වා වැඩි වී ඇත. මෙම වැඩිවීමේ උපනතිය පුහුණු දින ගණන,පුහුණුවුවන්ගේ ප්‍රමාණය ඉපයූ ආදායමෙහිද දක්නට ලැබේ.

2012 වර්ෂයේදී පුහුණුව ලද සමස්ත පුහුණුවුවන්ගෙන් (10331), 79.3% ක් තේ, පොල්, රබර්, උක්, සහ කජු බෝග වගාවන්හි නියුතු කුඩා වතු හිමියන් වූ අතර 14.7% ක් කුඩා රබර් වතු වගාකරුවන් සහ අමු තේ දළු ප්‍රවාහකයින් වූහ. වැවිලි සංස්ථානික අංශයට අනුයුක්ත පුද්ගලයින් පුහුණු කිරීම කෙරෙහි මෙම ආයතනය සැලකියයුතු අවධානයන් යොමු කර නොමැති බව මෙයින් ගම්‍ය නොවේ.පෙර වර්ෂ වලදී අත්දකින්නට ලැබුණු පරදි අධ්‍යාපනික පාඨමාලාසඳහා පැවති ඉල්ලුම එම තත්ත්වයේම පැවති අතර කුසලතා සංවර්ධනසහ කම්කරු සංවර්ධන ආදි වූ අධ්‍යාපනික නොවන වැඩසටහන් සඳහා ඉල්ලුමෙහි වැඩිවීමේඋපනතියක් දක්නට ලැබුණි. කුඩා වතු ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ වැඩ සටහන් ඉල්ලීම මත කුඩා රබර් වතු ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සංවර්ධන දැනුම ඉහල නැංවීම සඳහා වැඩ සටහන් 18 ක් ක්‍රියාත්මක විය.

ආයතනය විසින් වැඩි අවධානයක් සහ උත්සාහයක් යොමු කල නව පුහුණු අංශයක් වූයේ තේ, රබර්, පොල් සහ උක් යන බෝග වගාවන්හි නියුතු කුඩා වතු හිමියන්සඳහා පැවැත්වූ වැඩසටහන්ය.මෙම බෝග වලට අදාළසමස්ත නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද්දේ කුඩා වතු හිමියන් විසින් සපයන ලද අමුද්‍රව්‍ය වලිනි.මේ හේතුව නිසා කුඩාවතු හිමියන් විසින් සපයනු ලබන අමුද්‍රව්‍ය වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිණිස කුඩා වතුහිමියන් පුහුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවිය.මෙහි අවසන් ප්‍රතිඵලය නිම්භාණ්ඩ වල ඉහළ ගුණාත්මයක් සහතික කිරීමය. ආරම්භයක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදආයතනය විසින් උපයන ලද මුදලින් රුපියල් මිලියන 1.79 ක් වියදම් කොට කුඩා වතු හිමියන් සහකම්කරුවන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 74 ක් පවත්වන ලදි.මහා භාණ්ඩාගාරය විසින් 2012වර්ෂය සඳහා මෙම පුහුණු වැඩසටහන් වෙනුවෙන් රුපියල් මිලියන 05 ක් වෙන් කිරීමෙන් පෙන්නුම්කරනු ලබන්නේ කුඩා වතු හිමියන්ගේ භූමිකාවෙහි වැදගත්කම හා ඔවුන් සඳහා පවත්වනු ලබනපුහුණු වැඩසටහන් ප්‍රමාණය වැඩි කල යුතු බව මහා භාණ්ඩාගාරය විසින් පිළිගෙන ඇති බවය. මෙම වෙන්කිරීම් 2013 වර්ෂයේදී රුපියල් මිලියන 8.0 ක් වී ඇත.

සමාලෝචිත වර්ෂයේදී ආයතනයට මුහුණපෑමට සිදුවූ ප්‍රධානතම බාධකය වූයේ කාර්යමණ්ඩල හිඟයය. එහිදී නේවාසිකාගාර කළමනාකරු, පුහුණු කිරීමේ නිලධාරී (ගිණුම් හා මූල්‍ය කළමනාකරණය) යනාදි පුරප්පාඩු පැවති තනතුරු සේවා නියුක්ත කිරීම නොහැකි විය. මෙම තත්වයට බලපෑ ප්‍රධානම හේතුව වූයේ එම තනතුරු සඳහා ඉහල සුදුසුකම් ඉල්ලා තිබීමත් බඳවා ගැනීම් ක්‍රියාවලිය (SOR) මඟින් ලබා දී ඇති වැටුප තරඟකාරීව එම තනතුරු සඳහා ප්‍රමාණවත් නොවීමත්ය. මුහුණපෑමට සිදුවූ අනෙකුත් ගැටලු වලින් කිහිපයක් වූයේ සන්සන්දනාත්මකව අඩු දේශන ගාස්තුහේතුවෙන් පළපුරුදු බාහිර සම්පත්දායකයින්ගේ සේවය ලබා ගැනීමට නොහැකි වීම, අවශ්‍ය තරම්වාහන නොතිබීම සහ සතියේ දිනවල ආයතනයේ පැවැත්වෙන පුහුණු වැඩසටහන් වලට සහභාගිවීමටවතු විධායකයින් නිදහස්

නොකිරීම ආදියය. අනෙක් අතට කුඩා වතු හිමියන් පුහුණු කිරීමේ පුළුල්අවශ්‍යතාවයක් තිබුණද මුදල් අපහසුතා නිසා ඔවුහු පුහුණු වැඩසටහන් සඳහා ගෙවීමට මැලිකමක් දක්වති.නොඑසේනම් මෙම වියදම් දැරීමට වෙනත් ආයතනයක් නැත.

සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ මුළු ඉපයම් ආදායම කොරියානුවැඩසටහන් වලින් ඉපැයූ රුපියල් මිලියන 8.67 ක් සහිතව රුපියල් මිලියන 26.459 කි.බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයවිසින් රුපියල් මිලියන 3.8 ක් උපයමින් මුදල් ඉපයීමේ කාර්යයෙහි වැදගත් භූමිකාවක් රඟ දක්වනලදී.එහි සමස්ත වියදම රුපියල් මිලියන 2.04 ක් විය.සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සහපුනරාවර්තන වියදම් පිළිවෙලින් රුපියල් මිලියන 8.112 ක් හා රුපියල් මිලියන 49.529 ක් විය. ක්ෂය කිරීම් අඩු කිරීමෙන් පසු රුපියල් මිලියන 5.172 ක ඌනතාවයක් දක්නට ලැබුණද පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරය මත යැපීම් 21% ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. එය 2011 වර්ෂයේදී 25% ක් විය. පාලක මණ්ඩල මෙන්ම පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ විවිධ සාකච්ජා වලින් පසුව වැවිලි ක්ෂෙත්‍රයේ වර්තමාන තත්වයට ගැලපීම සඳහා ආයතනයේ කටයුතු එක්තරා මට්ටමකට විවිධාංගීකරණය කල යුතු බව පැහැදිලි විඇත. ඒ අනුව කුඩා වතු හිමියන් පුහුණු කිරීමේ වැඩ සටහන් සඳහා වැඩි අවධානයක් යොමු කරන අතරම කර්මාන්ත ශාලා නිලධාරීන්, ක්ෂෙත්‍ර නිලධාරීන්, කාර්මික ශිල්පීන්, වතු පුහුණුවන්නන් සඳහා වු පාරාරම්භක පාඨමාලාවන් පිළිබඳව ද අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍යවී ඇත. කෙසේ වෙතත් අධ්‍යාපනික පාඨමාලාවන් සඳහා පවතින ඉල්ලුමද වැඩිවෙමින් පවතින බැවින් එම පාඨමාලාවන් පැවැත්වීම කෙරෙහිද අවධානය යොමු කල යුතුව ඇත. තවදුරටත්, විදේශීය සිසුන් සඳහා පිරිනමන පාඨමාලාවන් මඟින් ඉහල ආදායම් ඉපයීමේ වැඩි අවස්ථාවක් පවතින බැවින් ඔවුන් සඳහා කාර්මික වැඩ සටහන් ආරම්භ කිරීමට ද ආයතනය අපේක්ෂා කරයි.

**පී.ඩබ්ලිව්.ඒ. කපිලවංශ**
**අධ්‍යක්ෂ**
**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## පරිපාලන වාර්තාව

1.0 ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 ජූලි මාසයේදී අංක 45 දරණ පාර්ලිමේන්තු පණත මඟින් ස්ථාපනය කරන ලදී. එම පණතෙහි සහ 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ සංශෝධිත පණත් වලින් දක්වා ඇති පරිදි ආයතනයේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

I. ආයතනය තනිවම හෝ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අනෙකුත් ආයතන සමඟ සහයෝගීව වැවිලි අංශයේ සේවයේ නියුතු සියළුම ශ්‍රේණි වලට අයත් සේවකයින් හට වැවිලි කළමනාකරණයට අදාල පුහුණුව ලබාදීම.

II. වැවිලි අංශයේ සේවයේ නියුතු සේවකයින් හට වැවිලි කළමනාකරණය පිළිබඳව ක්‍රමවත් සංස්කරණ පාඨමාලා සහ සේවාස්ථ පාඨමාලා සම්පාදනය කිරීම.

III. රාජ්‍ය හා පෞද්ගලික වැවිලි කර්මාන්ත අංශයන්හි සේවයේ නියුතු පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණු පාඨමාලා ලබාදීම.

IV. තේ පර්යේෂණ, රබර් පර්යේෂණ, පොල් පර්යේෂණ සහ උක් පර්යේෂණ ආයතනයන්හි සහභාගිත්වය ඇතිව වැවිලි කර්මාන්තය හා සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම.

V. වැවිලි කර්මාන්තය පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු, සහ සාකච්ඡා වලට අනුග්‍රහය දැක්වීම සහ පැවැත්වීම.

VI. වැවිලි කළමනාකරණය සහ සංවර්ධනයට අදාල ලේඛණ සහ සඟරා පළ කිරීම.

VII. වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතාවය යන අංශ වලට අදාල පර්යේෂණ සහ සංවර්ධන කටයුතු කිරීම.

VIII. ඵලදායී ලෙස වැවිලි කර්මාන්තයෙහි නියුක්ත කරවීමට ඇති හැකියාවන් හඳුනාගනිමින් වැවිලි කළමනාකරණයෙහි දක්ෂතා ඇති අයට වැවිලි කළමනාකරණ පුහුණු පාඨමාලා පිරිනැමීම.

IX. ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත පිහිටි වෙනත් ආයතනයකට වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් කළමනාකරණ තාක්ෂණික සහ පරිපාලනමය උපදෙස් සහ සේවා සැපයීම.

X. ආයතනයේ විවිධ සාමාජිකත්ව ශ්‍රේණි වලට ප්‍රවේශ වීමට අපේක්ෂකයින්ට ඇති යෝග්‍යතාවය තක්සේරු කිරීම සහ සියළුම ශ්‍රේණිවල සාමාජිකත්ව සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම, එසේ පැවැත්වීමට ඉඩ සැලසීම සහ එවැනි පරීක්ෂණ සඳහා වූ අධ්‍යාපන පාඨමාලා සංවර්ධනය කිරීම, සැපයීම හෝ අනුමත කිරීම.

XI. තම සාමාජිකයින්ගේ වෘත්තීය කටයුතු වල සහ පොදු චර්යාවෙහි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සහතික කිරීම.

XII. වැවිලි කළමනාකරණ අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

XIII. වැවිලි සහ වැවිලි කළමනාකරණයට අදාල දත්ත රැස් කිරීම, ඒවා බෙදා හැරීම සහ වැවිලි අංශයේ වර්ධන හැකියාවන් තහවුරු කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.

XIV. වැවිලි කළමනාකරණයට අදාල විධිමත් ප්‍රතිපත්තීන් පිළිබඳව ඇමතිතුමාට උපදෙස් ලබාදීම සහ අනෙකුත් අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

**2.0 පාලක මණ්ඩලයේ සංයුතිය**

**2.1** 1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 06 වන වගන්තිය සහ 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ සංශෝධිත පනත්වල විධිවිධාන වලට අනුව වර්ෂයේ පාලක මණ්ඩලය පහත දැක්වෙන අයගෙන් සමන්විත විය.

| | *නම* | *සාමාජික ස්වරූපය* | *කාලය* |
|---|---|---|---|
| 1) | රංජිත් සමරසිංහ මහතා<br>සභාපති<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සභාපති (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 2) | ආචාර්ය ඩබ්.එම්.ජී. සෙනෙවිරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>රබර් පර්යේෂණ ආයතනය | සාමාජික (නිලබලයෙන්) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 3) | ආචාර්ය අයි.එස්.බී. අබේසිංහ මහතා<br>අධ්‍යක්ෂ<br>තේ පර්යේෂණ ආයතනය | සාමාජික (නිල බලයෙන්) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 4) | ආචාර්ය ජයන්ත ගුණතිලක මහතා<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණ ආයතනය | සාමාජික (නිල බලයෙන්) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 5) | ආචාර්ය ඩී.වී. සිවරත්නම් මහතා<br>නියෝජිත<br>ලංකා වැවිලිකරුවන්ගේ සංගමය | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 6) | අර්ජුන් දැරණියගල මහතා<br>නියෝජිත<br>පොල් වැවිලිකරුවන්ගේ සංගමය | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |

| | | | |
|---|---|---|---|
| 7) | එන්.පී. පියසේන මහතා<br>ගණකාධිකාරී<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 8) | රංජන් වල්පොල මහතා<br>නියෝජිත<br>පෞද්ගලික තේ කම්හල්හිමියන්ගේ සංගමය | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 9) | ලෝෂිනී පීරිස් මිය<br>අධ්‍යක්ෂ<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 10) | කේ.පී.බී. ඔබේසේකර මහතා<br>සාමාන්‍යාධිකාරී<br>කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 11) | එස්.පී. හිදැල්ලආරච්චි මහතා<br>සභාපති<br>තුරුසවිය අරමුදල | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 12) | ඩබ්.ඩී. ජයරත්න මහතා<br>ගරු ලේකම්<br>කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය | සාමාජික (පත්කල) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 13) | මාලින් ගුණතිලක මහතා<br>ලේකම්<br>ලංකා වැවිලිකරුවන්ගේ සංගමය | නිරීක්ෂණ සාමාජික | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 14) | සරත් සිරිසේන මහතා<br>අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී<br>ලංකා තැරැව්කරුවන්ගේ සංගමය | නිරීක්ෂණ සාමාජික | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 15) | පී.ඩබ්.ඩී.කපිලවංශ මහතා<br>අධ්‍යක්ෂ<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සාමාජික (නිල බලයෙන්) | 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |

## 2.2 පාලක මණ්ඩලයේ ලේකම්

ජේ.එම්.ඩී. කරුණාරත්න මිය (2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා)
සහකාර අධ්‍යක්ෂිකා (පාලන)

## 2.3 පාලක මණ්ඩලයේ රැස්වීම්

සමාලෝචිත වර්ෂයේදී පාලක මණ්ඩලයේ රැස්වීම් වාර 10ක් අතුරුගිරිය ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේදී පවත්වන ලදී. මෙම රැස්වීම් වලදී පහත සඳහන් කරුණු සමාලෝචනය කිරීම/පැහැදිලි කිරීම සහ අනුමත කිරීම් කරන ලදී.

I. අයවැය ඇස්තමේන්තු සංශෝධන.

II. ලැබිය යුතු පාඨමාලා ගාස්තු, ඒවා අයකර ගත හැකි මාර්ග සහ අයකර ගත නොහැකි පාඨමාලා ගාස්තු සාධාරණ හේතු මත කපා හැරීම.

III. ආයතනයේ පුහුණු කිරීමේ කටයුතු, ගිණුම් සහ පරිපාලන අංශයන්ට අදාල අනෙකුත් කටයුතු

IV. ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන දේශීය සහ විදේශීය ශිෂ්‍යත්ව සහ වැඩමුළු.

V. විවිධ අංශයන්හි කාර්යභාරය පිළිබඳ ප්‍රගතිය.

VI. විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලද කාරණා

VII. ආයතනය විසින් පිළියෙල කරන ලද පසුගිය වර්ෂයට අදාල විගණන ගැටළු සඳහා පිළිතුරු.

VIII. නව තනතුරු සඳහා බඳවා ගැනීම් සහ උසස් වීම්.

IX. යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම කිරීම.

X. ඊළඟ වර්ෂයට අදාල අයවැය ඇස්තමේන්තුව

XI. පසුගිය වර්ෂයට අදාල පරිපාලන වාර්තා සහ අවසාන ගිණුම්

XII. ආයතනයේ වැඩ කටයුතු වල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා උපාය මාර්ග

XIII. ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු

XIV. අධ්‍යාපනික සහ වෘත්තීය වැඩසටහන් වල ප්‍රතිඵල

XV. විභාග පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින්

XVI. ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්

## 2.4 විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

| | | |
|---|---|---|
| ලෝෂිනී පීරිස් මිය<br>අධ්‍යක්ෂ/විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | - | සභාපතිනි |
| එන්. පී. පියසේන මහතා<br>ගණකාධිකාරී<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | සාමාජික |
| පී.ඩබ්.ඒ. කපිලවංශ මහතා<br>අධ්‍යක්ෂ<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | සාමාජික |
| එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතා<br>ගණකාධිකාරී<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | කමිටු ලේකම් |
| ලලනි ගුණතිලක මිය<br>විගණන අධිකාරී<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව | - | නිරීක්ෂණ සාමාජික |
| ඩබ්.ඒ.ඩී.ඩී.එම්. ප්‍රියන්ත මහතා<br>අභ්‍යන්තර විගණන<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | නිරීක්ෂණ සාමාජික |

## 2.5.1 දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන කොන්ත්‍රාත්තු)

| | | |
|---|---|---|
| රංජිත් සමරසිංහ මහතා<br>සභාපති/ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | සභාපති |
| එන්.පී. පියසේන මහතා<br>ගණකාධිකාරී<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | සාමාජික |
| පී.ඩබ්.ඒ. කපිලවංශ මහතා<br>අධ්‍යක්ෂ<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | සාමාජික |

### 2.5.2 දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු කොන්ත්‍රාත්තු)

| | | |
|---|---|---|
| පී.ඩබ්.ඒ. කපිලවංශ මහතා<br>අධ්‍යක්ෂ<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | සභාපති |
| එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතා<br>ගණකාධිකාරී<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | - | සාමාජික |
| ජේ.එම්.ඩී. කරුණාරත්න මිය<br>සහකාර අධ්‍යක්ෂිකා (පරිපාලන) | - | සාමාජික |

## 2.6 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

ඉහතින් සඳහන් කල පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකුද (රාජ්‍ය භාණ්ඩාගාරයේ සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නියෝජිතයෙකු), ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ සහ ගණකාධිකාරී යන අය මෙම කමිටුවේ සාමාජිකයින් වේ. මීට අමතරව රාජ්‍ය විගණන අධිකාරී සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක නිරීක්ෂණ සාමාජිකයින් ලෙස රැස්වීම් වලට සහභාගී වේ. ඔවුන් ඉදිරියේ ඇති සියළු කාරණා ඵලදායී ලෙස අධ්‍යයනය කිරීමටත්, තීරණ ගැනීමටත් ඔවුන්ගේ සහභාගීත්වය උපකාරී විය.

සලකා බලනු ලබන වර්ෂය තුළ රැස්වීම් වාර අටක් (08) පවත්වා ඇති අතර, පහත සඳහන් කාරණා සඳහා සාකච්ඡා පැවැත්වීම් සහ නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

1) විගණක ගැටළු සහ පිළිතුරු වලට අදාල කරුණු.
2) ප්‍රසම්පාදන කමිටු තීරණ සහ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වල භාවිතය.
3) අයවැය ඇස්තමේන්තු සහ ඒ ඒ කාල පරිච්ඡේදයන්හි සත්‍ය පිරිවැය සමාලෝචනය.
4) අතිකාල දීමනා, ඉන්ධන භාවිතය, දුරකථන ගාස්තු සහ ප්‍රවාහන වියදම් යනාදිය පිළිබඳව දරන ලද වියදම් අයවැය ඇස්තමේන්තුව සමඟ සන්සන්දනය කිරීම.
5) පුහුණු කිරීමේ වැඩසටහන් වලට අදාල ආදායම් හා වියදම්.
6) පුහුණු කිරීම්, පරිපාලන හා ගිණුම් අංශ වලට අදාල අනෙකුත් මූල්‍ය කටයුතු.

## 3.0 ආයතනීය කාර්ය මණ්ඩලය - 2012

### 3.1.1 තනතුර

| තනතුර | ප්‍රමාණය |
|---|---|
| සභාපති | 01 |
| අධ්‍යක්ෂ | 01 |

### 3.1.2 පුහුණු කිරීම් අංශයේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) | 01 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ) | 01 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) | 01 |
| පුහුණු කිරීමේ නිලධාරි (කළමනාකරණ) | 01 |
| මාණ්ඩලික සහකාර (පුහුණු කිරීම්) | 01 |
| පුස්තකාලයාධිපති | 01 |
| ලිපිකරු (1 ශ්‍රේණිය) | 01 |
| ලඝුලේඛක (ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය | 02 |
| ලිපිකරු/ පරිගණක ක්‍රියාකරු | 01 |
| කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) | 02 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

### 3.1.3 පරිපාලන අංශයේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | 01 |
| නේවාසිකාගාර කළමනාකරු | 01 |
| ලිපිකරු - 1 ශ්‍රේණිය | 01 |
| ලඝුලේඛක (ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය | 01 |
| වැඩ පරීක්ෂක | 01 |
| කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) | 03 |
| රියදුරු (කොන්ත්‍රාත් 01 අයෙකු සමඟ) | 05 |
| උද්‍යාන සහායක (කොන්ත්‍රාත් 4 දෙනෙකු සමඟ) | 04 |
| කාර්යාල කාර්ය සහායක (කොන්ත්‍රාත් 3 දෙනෙකු සමඟ) | 05 |
| සනීපාරක්ෂක කම්කරු (කොන්ත්‍රාත්) | 01 |

### 3.1.4 ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| ගණකාධිකාරී | 01 |
| ලිපිකරු - 1 ශ්‍රේණිය | 01 |
| ගබඩා භාරකරු | 01 |
| පොත් තබන්නා | 01 |
| ලඝු ලේඛක ඉංග්‍රීසි - 11 ශ්‍රේණිය | 01 |
| ලිපිකරු/යතුරු ලේඛක | 01 |
| කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) | 01 |
| කාර්යාල කාර්ය සහායක (කොන්ත්‍රාත්) | 01 |

### 3.2 ආයතනීය ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

| | | |
|---|---|---|
| රංජිත් කුමාර සමරසිංහ මහතා | - | සභාපති |
| පී. ඩබ්. ඒ. කපිලවංශ මහතා | - | අධ්‍යක්ෂ |
| එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතා | - | ගණකාධිකාරී |
| පී. එච්. ජයතිලක මහතා | - | පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළම.) |
| එස්. එන්. ඉලංගන්තිලක මිය | - | පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) |
| ආර්. එන්. ලොකුහෙට්ටි මිය | - | පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ) |
| ජේ.එම්.ඩී. කරුණාරත්න මිය | - | සහකාර අධ්‍යක්ෂිකා (පාලන) |

ආයතනයේ තනතුරු පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් (DMS) 2010 සැප්තැම්බර් මස 06 වන දින අනුමත කල අතර, බඳවා ගැනීමේ පටිපාටිය (SOR) 2011 පෙබරවාරි 23 දින අනුමත කරන ලදී. මෙම අනුමැතීන්ට අනුව කණිෂ්ඨ පෙල කළමනාකරණ මට්ටමේ පැවති ගණකාධිකාරී තනතුර එහි ඇති වගකීම් සහ කරනු ලබන කාර්යන්හි වැදගත්කම සලකා මැද පෙල කළමනාකරණ මට්ටමට උසස් කරන ලදී. තවද මාණ්ඩලික සහකාර (පුහුණු කිරීම්) තනතුර ඉවත් කල අතර, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ පැවති ශ්‍රව්‍ය දෘෂ්‍ය නිලධාරී තනතුර එම මට්ටමට අදාල සුදුසුකම් වලට නොගැලපෙන බැවින්, කළමනාකරණ සහකාර තනතුර දක්වා පහත හෙලන ලදී.

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## සංවිධාන ව්‍යුහය



## 4.0 පුහුණු කිරීමේ අංශය

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනත හා ඊට පසුව ඇති කරන ලද සංශෝධන පනත්වලට අනුකූලව ආයතනයේ මූලික අරමුණ වන්නේ කුඩා වතු හිමියන් ඇතුළු වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ වූ අය සඳහා ඉගෙනීමේ හා පුහුණු වීමේ අවස්ථා ලබා දීමයි.වැවිලි අංශය යනුවෙන් අර්ථ දැක්වෙන්නේ තේ, රබර්, පොල්, උක්, කජු, තල්, කිතුල් සහ කුරුඳු ආදි බහු වාර්ෂික බෝගයන් වේ. මෙම අරමුණු දිනා ගැනිම සඳහා සිදු කෙරෙන ආයතනයේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් කොටස් 07 කට බෙදා දැක්විය හැක.

### අ) අධ්‍යාපනික පාඨමාලා පැවැත්වීම

- වයඹ විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව පවත්වනු ලබන වැවිලි කළමනාකරණයපිළිබඳ උපාධි පාඨමාලාව
- වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
- වැවිලි ව්‍යාප්තිකරණ කළමනාකරණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
- වැවිලි ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ව්‍යාපාර ඉංග්‍රිසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- දෙමළ භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- පුහුණුවන තේ කර්මාන්තශාලා නිලධාරීන් සඳහා පෙරහුරු පාඨමාලාව
- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා කළමනාකරණය පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගය
- තේ වගාව පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාව
- රබර් වගාව පිළිබඳ ජාතික සහතික පත්‍ර පාඨමාලාව
- ආධුනිකයින් සඳහා වතු පාලනය පිළිබඳ පෙරහුරු පාඨමාලාව
- ආධුනිකයින් සඳහා වතු පාලනය පිළිබඳ උසස් පුහුණු පාඨමාලාව

### ආ)වෘත්තිය පාඨමාලා පැවැත්වීම

- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- පොල් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- භාෂා ප්‍රවීනතා විභාගය
- තේ වගාව පිළිබඳ වෘත්තිය පාඨමාලාව
- රබර් වගාව පිළිබඳ වෘත්තිය පාඨමාලාව

ඇ)**<u>නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම</u>**

- විවිධ වැඩමුළු, සම්මන්ත්‍රණ හා සංසඳ
- කුසලතා වර්ධන පුහුණු වැඩසටහන්
- කම්කරු සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- කුඩා වතුහිමියන් සඳහා පුහුණු වැඩසටහන්

**ඇ)** වැවිලි කළමනාකරණය පිළිබඳ ප්‍රකාශන නිකුත් කිරීම. (වැවිලි කළමනාකරණය පිළිබඳ සඟරාව, පුවත් ලිපිය, විවිධ වැඩසටහන්වලට අදාල පුහුණු අත්පොත් සහ වෙනත් කාලීන ප්‍රකාශන)

**ඉ)** වැවිලි කළමනාකරණය පිළිබඳ සමීක්ෂණ හා උපදේශන සේවා සැපයීම සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා විභාග (ලිඛිත හා වාචික) පැවැත්වීම.

**ඊ)** සුදුසුකම්ලත් වැවිලි විධායකයින් සඳහා ආයතනික වෘත්තිය සාමාජිකත්වය පිරිනැමීම. (ගෞරව සාමාජිකත්වය, පූර්ණ සාමාජිකත්වය, ආශ්‍රිත සාමාජිකත්වය සහ ශිෂ්‍ය සාමාජිකත්වය)

**උ)** රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා පුහුණු පහසුකම් සැපයීම. (ආහාරපාන, නවාතැන්, දේශන ශාලා සහ ප්‍රවාහන පහසුකම් ආදිය)

## 4.1 <u>2012 වර්ෂය තුළ සිදුකල පුහුණු කිරීමේ කටයුතු</u>

2012 වර්ෂයේදී ආයතනය විසින් මූලික වශයෙන් වැවිලි ක්ෂේත්‍රය සහ කුඩා වතු හිමියන් සඳහා දෙයාකාරයකින් වැඩසටහන් පවත්වන ලදි. මෙහිදී වැවිලි ක්ෂේත්‍රය යනුවෙන් හඳුන්වනු ලැබුවේ වැවිලි සමාගම් මගින් පාලනය වන වතු සහ වැවිලි ක්ෂේත්‍රයට අදාල ආයතන වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD), පොල් පර්යේෂණ ආයතනය (CRI), තේ මණ්ඩලය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB)යනාදිය යි. කුඩා වතු හිමියන් ලෙස හඳුන්වනු ලැබුවේ කුඩා වතු හිමියන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන(SPENDP) සහ තේ ශක්ති අරමුදල ආදිය වේ.මෙම වැඩසටහන්අපගේ කාර්ය දර්ශනයට ඇතුළත් කර ඇති අතර 2012 වර්ෂය තුළදී පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැඩ සටහන් වර්ගය | වැඩ සටහන් ප්‍රමාණය | එක් එක් වැඩසටහන් සඳහා කාලය | පුහුණු වූවන්සංඛ්‍යාව |
|---|---|---|---|
| 01.වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධි පාඨමාලාව | කණ්ඩායම් 01 | වසර 03 | 47 |
| 02. වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාපාඨමාලාව | කණ්ඩායම් 01 | මාස 18 | 16 |
| 03.වැවිලි ව්‍යාප්තිකරණ කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | කණ්ඩායම් 02 | මාස 18 | 36 |
| 04.තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය පිළිබඳ වෘත්තිය පාඨමාලාව | කණ්ඩායම් 02 | දින 07 | 50 |
| 05.වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රපාඨමාලාව | කණ්ඩායම් 02 | මාස 12 | 60 |
| 06.පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළබඳ සහතික පත්‍ර පාඨමාලාව | කණ්ඩායම් 02 | මාස 12 | 33 |
| 07. හලාවත වැවිලි සමාගමේ කාර්ය මණ්ඩලයසඳහා පුහුණු වැඩසටහන | කණ්ඩායම් 01 | දින 02 | 60 |
| 08.පොල් පර්යේෂණ ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන | කණ්ඩායම් 01 | දින 02 | 27 |
| 09.රබර් ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කුසලතාවර්ධන පුහුණු පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 05 | 15 |
| 10.තේ කර්මාන්තශාලා නිලධාරීන් සඳහාකුසලතා වර්ධන පුහුණු පාඨමාලාව | කණ්ඩායම් 02 | දින 05 | 68 |
| 11.ආධුනිකයින් සඳහා වතු පාලක පෙරහුරුපාඨමාලාව | කණ්ඩායම් 02 | මාස 06 | 59 |
| 12. තේ දළු ප්‍රවාහනය පිළිබඳ පුහුණු වැඩ සටහන | කණ්ඩායම් 19 | දින 02 | 943 |
| 13. කුඩා වතු හිමියන් සඳහා වැවිලිව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | කණ්ඩායම් 18 | දින 02 | 574 |
| 14. ව්‍යාපාරික ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව | කණ්ඩායම් 02 | මාස 10 | 26 |
| 15. රබර් වගාව පිළිබඳ වෘත්තිය පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 05 | 16 |
| 16. කටු පොල් වගාව පිළිබඳ පාඨමාලාව | කණ්ඩායම් 01 | දින 02 | 30 |
| 17.රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රනිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | කණ්ඩායම් 03 | දින 05 | 107 |
| 18.තේ ශක්ති අරමුදලේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන | කණ්ඩායම් 01 | දින 01 | 15 |
| **මුළු ගණන** | **61 *** | **දින 678** | **2135** |

**උපාධි පාඨමාලාව ඇතුළත් නොවේ.*

**4.2** 2012 වර්ෂයේදි අපේක්ෂා කරනු ලැබූ වැඩසටහන් ප්‍රමාණය සහ පවත්වනු ලැබූ වැඩසටහන් ප්‍රමාණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් පහත දැක්වේ.2012 කාර්ය දර්ශනයට අනුවආයතනය මගින් පුහුණු වැඩසටහන් 69 ක් සහ පුහුණුවන්නන් 2038 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් සකස් කර තිබුණි. මේ සඳහා රු. මිලියන 15.86 ක ආදායමක් පුහුණු කිරීමේ කටයුතු තුළින් උපයා ගැනිමට අදහස් කරන ලදි.කෙසේ වෙතත් ආයතනය මගින් පුහුණු කිරීමේ වැඩසටහන් 61 ක් සහ පුද්ගලයින් 2135 දෙනෙකු පුහුණු කල අතර රු. මිලියන 12.85 ක මුදලක් උපයා ගන්නා ලදි.ඉලක්කගත වැඩ සටහන් සංඛ්‍යාවෙන් 74.7% ක් සහ පුහුණුවන්නන් සංඛ්‍යාවෙන් 98% ක් ලෙස මේ වසර තුළ සත්‍ය කාර්ය සාධනයක් පෙන්වා ඇත. අපේක්ෂිත ප්‍රමාණයෙන් 78.3% ක ආදායමක් උපයා ගන්නා ලදි.වයඹ විශ්ව විද්‍යාලය සමග පවත්වනු ලබන වැව්ලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදි උපාධි පාඨමාලාව ඒකාබද්ධ ප්‍රයත්නයක් බැවින් ඒ පිළිබඳ විස්තර මෙයට ඇතුළත් නොවේ.

**<u>පුහුණු වැඩසටහන් - 2012 - ඇස්තමේන්තුගත ප්‍රමාණය සහ සත්‍ය ප්‍රමාණය</u>**

| **වැඩ සටහනේ නම** | **ඇස්තමේන්තුගත** | | | **සත්‍ය** | | | **ප්‍රගතිය** | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ සටහන් ප්‍රමාණය | සිසුන් ගණන | ආදායම රු. මිලියන | වැඩ සටහන් ප්‍රමාණය | සිසුන් ගණන | ආදායම රු. මිලියන | වැඩ සටහන් ප්‍රමාණය | සිසුන් ගණන | ආදායම රු. මිලියන |
| අධ්‍යාපනික සහ වෘත්තිය පාඨමාලා | 15 | 328 | 8.18 | 12 | 237 | 4.1 | 80% | 72% | 51% |
| කුසලතා වර්ධන වැඩසටහන් | 05 | 95 | 1.22 | 05 | 140 | 1.0 | 100% | 147% | 80% |
| කම්කරු සංවර්ධන සහ ව්‍යාපෘති වැඩසටහන් | 22 | 700 | 1.34 | 18 | 574 | 0.68 | 81% | 82% | 51% |
| වතු පාලක පෙරහුරු පාඨමාලාව | 03 | 40 | 2.5 | 02 | 59 | 3.5 | 67% | 147% | 140% |
| විශේෂ පුහුණු වැඩසටහන් | 20 | 800 | 2.4 | 24 | 1125 | 3.57 | 120% | 140% | 148% |
| කළමනාකරණ සහ ව්‍යාපාරික සංවර්ධන වැඩසටහන් | 4 | 75 | 0.22 | - | - | - | 0% | 0% | 0% |
| **මුළු ගණන** | **69** | **2038** | **15.86** | **61** | **2135** | **12.85** | **74.7%** | **98%** | **78.3%** |

කුඩා වතු හිමියන් සඳහා කරනු ලැබූ වැඩසටහන් වලට මහා භාණ්ඩාගාරය වෙතින් මුදල් ලැබුණු බැවින් ඒවා මුදල් අය කිරීමකින් තොරව සිදු කරනු ලැබූ අතර එබැවින් ඒවා මෙහි ඇතුළත් නොකරන ලදි.අවාසනාවකට මෙන් කළමනාකරණ සහ ව්‍යාපාරික සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් තරම්ඉල්ලුමක් නොතිබූ බැවින් මෙම වැඩ සටහන් පැවැත්වීමට නොහැකි විය. එබැවින් අපගේ කාර්ය සාධනය බලාපොරොත්තු වූ මට්ටමට වඩා පහළ වැටුණි.

## 4.3 කුඩා වතු හිමියන් සඳහා පාඨමාලා

2011.04.08 දින රැස්වූ රාජ්‍ය ව්‍යාපාරසම්බන්ධ පොදු කාරකසභා (COPE)රැස්වීමේදී ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ කළමනාකාරිත්වය විසින්, සමස්ත නිෂ්පාදනයෙන් 75% ක් පමණ නිෂ්පාදන දායකත්වයක් දරණ කුඩා වැවිලි අංශය සඳහා කිසිදු පාඨමාලාවක් පවත්වා නැති බව සම්බන්ධව ප්‍රශ්න කරන ලදි.පිරිවැය දරා ගැනිමට තිබූ මූල්‍යමය භාදක නිසා කුඩා වතු හිමියන් සඳහා ආයතනය විසින් කිසිදු වැඩසටහනක් පවත්වනු ලැබුවේ නැත. ගුණාත්මක බවින් ඉහළ නිෂ්පාදන නිපදවීම සඳහා ඔවුන්ගේ දැනුම සහ කුසලතා සවිබල ගැන්වීමට අවශ්‍ය බව ආයතනය පිළිගනී.

පොදු කාරකසභා (COPE)රැස්වීමේදී මතු කල කරුණ පදනම් කොට ගෙන 2011 වර්ෂයේදී ආයතනයේ ඉපැයීම් වලින් මිලියන 1.7 ක් වැය කර කුඩා වැවිලි අංශය සඳහා පාඨමාලාවන් 74 ක් පවත්වන ලදි.

මහින්ද චින්තන ප්‍රතිපත්තියේ සඳහන් පරිදි කුඩා වැවිලි ව්‍යවසායකයින් හා නිෂ්පාදකයින් දිරිමත් කිරිම යන ප්‍රකාශයට අනුකූලව යමින් ආයතනයේ ඉපයීම් වලින් කුඩා වතු හිමියන්ට වැඩසටහන් පැවැත්වීම අගය කරමින් සහකුඩා වතු හිමියන්ගේ භූමිකාව අවබෝධ කොට ගෙන කුඩා වැවිලි අංශයේ පාඨමාලාවන් පැවැත්වීම සඳහා රු. මිලියන 5.0 ක මූල්‍ය ප්‍රතිපාදන 2012 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මගින් ලබා දී ඇත.

කුඩා වතු හිමියන් සඳහා වැඩසටහන් පැවැත්වීමට මහා භාණ්ඩාගාරය විසින් ආයතනය වෙත මූල්‍යමය ප්‍රතිපාදන ලබා දුන් පළමු අවස්ථාව මෙය වේ.

කුඩා වැවිලි ක්ෂේත්‍රය සඳහා පැවැත්වූ පාඨමාලාවන් ධාරිතා වර්ධන පාඨමාලා යටතේ පවත්වන ලදි.එකී වියදම් ප්‍රාග්ධන වියදම් ගණයට ගණන් ගැනේ. පහත සඳහන් වගුවේ දැක්වෙන පරිදි අදාල කාලය තුළදී කුඩා වැවිලි ක්ෂෙත්‍රය සඳහා පැවැත්වූ පාඨමාලාවන් සාපේක්ෂාව සංසන්දනය කොට ඇති අතර එහිදී අදාල වර්ෂයේ සත්‍ය පාඨමාලාවන් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කොට ඇත.

**කුඩා වැවිලි ක්ෂෙත්‍රය සඳහා පැවැත් වූ ධාරිතා වර්ධන පාඨමාලා - 2012**

| වැඩ සටහන් වර්ගය | වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගි වූවන් ගණන | පිරිවැය (රු. මිලියන) |
|---|---|---|---|
| කුඩා රබර් වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් | 60 | 3,069 | 1.87 |
| කුඩා තේ වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් | 62 | 2,387 | 1.02 |
| කුඩා පොල් වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් | 54 | 2,288 | 1.37 |
| කුඩා කජු වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් | 04 | 160 | 0.09 |
| කුඩා උක් වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් | 07 | 279 | 0.14 |
| පුහුණු වන තේ කර්මාන්තශාලා නිලධාරින් සඳහා පුහුණු වැඩසටහන් | 01 | 13 | 0.42 |
| **පවත්වන ලද වැඩසටහන් ගණන** | **188** | **8,196** | **4.865** |
| **සැලසුම් කල වැඩසටහන් ගණන** | **70** | **2,800** | **5.00** |

රජයෙන් ලද රු. මිලියන 5.0 ක මුදල භාවිතා කරමින් පාඨමාලාවන් 70 ක් පැවැත්වීමට සැලසුම් කලද, පාඨමාලාවන් 188 ක් පවත්වා 268.6% ක ප්‍රගතියක් පෙන්වන ලද. අනුයුක්ත කරන ලද අරමුදල වැඩි නොකොට මෙතරම් ප්‍රගතියක් ලබා ගත්තේ කෙසේද යන්න ප්‍රශ්නයක් විය හැක. මෙසේ හැකි වී ඇත්තේ එක් පාඨමාලාවක් පැවැත්වීම සඳහා පිරිවැය ගණනයකිරීමේදීඉන් කොටසක් පාඨමාලාවක්සඳහා සහභාගිවන්නෙකු සඳහා ඔහු හෝ ඇය පාඨමාලාවට සහභාගී වීමෙන් තම අහිමි වන දිනක ඉපයීම ආවරණය වීම සහ ඔවුන්ගේසහභාගී වීම පෙළඹවීම සඳහා රු. 1,000/- ක දීමනාවක් ගෙවීමට වෙන් කොට තිබුණු නමුත් ආයතනයේ පුහුණු අංශයේ නිලධාරීන්ගේ මෙන්ම බාහිර දේශකයන්ගේද අදහස වූයේ පුහුණුව තුළින් එක් එක් පුද්ගලයාගේ දැනුම හා කුසලතාවය ඉහළනැංවීමසිදුවන බැවින්ද, ඉන් ඵලදායීතාවය ඉහළ යාමක් සිදුවන බැවින්ද, එක් එක් සහභාගිවන්නන්ට මෙසේ දීමනාවක් ගෙවීම අනවශ්‍ය බවත්, එසේම ක්ෂේත්‍රයේ සිටින අනෙක් අයදමෙවැනි නොමිලේ පාඨමාලාවන් අපේක්ෂා කිරීමට මෙය පූර්වාදර්ශයක් විය හැකි බවත්ය.එබැවින් එක් එක් සහභාගිවන්නෙකු සඳහා දීමනාවක් නොගෙවා එම මුදල්ද භාවිතා කොට පාඨමාලාවන් පැවැත්වීමට ආයතනය තීරණය කල බැවින් පාඨමාලාවන් සංඛ්‍යාව 70 සිට 188 දක්වා වර්ධනය වී ඇත.

මෙම සියලු පාඨමාලාවන් ඒ ඒ ප්‍රදේශ වල තේ, රබර්, පොල්, කජු සහ උක්යන ක්ෂේත්‍ර වලදී පවත්වන ලදී. එහිදී න්‍යායාත්මක දේශන වලට වඩා වැඩි කාලයක් ප්‍රායෝගික පුහුණු සැසි හා ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද.මෙවැනි පාඨමාලාවක් සඳහාකාලය පැය 05 කට සීමා කරන ලදී.පාඨමාලාවන් සඳහා සහභාගිවන්නන් දිරිමත් කිරිම සහ ඔවුන් එම ස්ථානයේ රඳවා ගැනීම සඳහා උදේ, සවස කෙටි කෑම සමග තේ හා දිවා ආහාරය ඒ ඒ ස්ථාන වලදීම සපයනලදී. අප විසින් කරන ලද සීමිත පසු විපරම් පාඨමාලා වලදී අප පළමුවෙන් කරන ලද පාඨමාලාවන් සඳහා ලැබුණු හොඳ ප්‍රතිචාරයන් සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

ඉහත කරන ලද විස්තරයන් පෙර වර්ෂ හා සංසන්දනාත්මක ලෙස පහතින් සඳහන් කර ඇත.

**<u>සාරාංශගත තොරතුරු</u>**

| | 2011 | 2012 | ප්‍රගතිය % |
|---|---|---|---|
| වැඩ සටහන් ගණන (එකතුව) | 104 | 249 | 239.4% |
| සහභාගී වූවන් ගණන (එකතුව) | 4,268 | 10,331 | 242.1% |
| කුඩා වතු හිමියන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් ගණන | 74 | 188 | 254.1% |
| පුහුණු වූ කුඩා වතු හිමියන් ගණන | 3,292 | 8,196 | 249.0% |
| පුහුණු දින ගණන (එකතුව) | 884 | 1,020 | 115.4% |
| ඉපයූ ආදායම | රු. මිලියන 36.79 | රු. මිලියන 44.357 | 120.5% |
| කුඩා වතු හිමියන් පුහුණු කිරීම සඳහා දරන ලද වියදම | රු. 1.79 | රු. මිලියන 4.865 | 271.8% |
| NIPMපුහුණු කාර්ය මණ්ඩලය | 05 | 05 | 0% |
| එක් සේවකයෙකුගෙන් ඉපයූ ආදායම | රු. 554,000 | රු. 575,000 | 103.8% |
| කුඩා වතු හිමියෙකු සඳහා දරණ ලද වියදම | රු. 543 | රු. 593 | 109.2% |

2012 වසරේදි පවත්වන ලද පුහුණු වැඩසටහන් සහ පුහුණු වූවන් පිළිබඳ තොරතුරු පිටු අංක 20දැක්වේ.

**<u>2012 වසරේ පුහුණුවූවන්</u>**

| | |
|---|---|
| වැවිලි විධායකයින් | 247 |
| ක්ෂෙත්‍ර කාර්ය මණ්ඩලය | 179 |
| කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය | 68 |
| ලිපිකරුවන් | 124 |
| කුඩා රබර් වතු ව්‍යවසායකයින් සහ තේ දළු ප්‍රවාහකයින් | 1,517 |
| කුඩා වතු හිමියන් | 8,196 |




**<u>2012 වසරේ පවත්වන ලද පුහුණු වැඩසටහන්</u>**

| | |
|---|---|
| වැවිලි විධායකයින් | 11 |
| ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය | 06 |
| කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය | 02 |
| ලිපිකරුවන් | 05 |
| කුඩා රබර් වතු ව්‍යවසායකයින් සහ තේ දළු ප්‍රවාහකයින් | 37 |
| කුඩා වතු හිමියන් | 188 |
| **මුළු ගණන** | **249** |




## 4.4 ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරිපුහුණු කිරීමේ පාඨමාලාව

තේ දළු නිෂ්පාදනයේදි සහ සැපයීමේදි කුඩා වතු හිමියන්ට උපකාරී වීමේ අරමුණෙන් ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රධානපාඨමාලාවක් ලෙස ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරීන් පුහුණු කිරීමේ පාඨමාලාවහැඳින්විය හැකිය. නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රමානුකූල වූ විධිමත් ක්‍රියා පටිපාටියක් නොමැති වීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් තේ අමු දළු මිලදී ගන්නා කර්මාන්තශාලාවන්හි පුහුණු තේ කර්මාන්තශාලා නිලධාරීන්ගේ උග්‍ර හිඟයක් වර්තමානයේදි දක්නට ලැබේ. දැනට සිටින බොහොමයක් තේ කර්මාන්තශාලා කාර්ය මණ්ඩලයන් සතුව ප්‍රමාණවත් අත්දැකීම් ඇතත් ඔවුන් සතු  න්‍යායාත්මක/ විද්‍යාත්මක දැනුම ඉතා දුර්වල මට්ටමක පවතී. මෙම තත්ත්වය අවසන් නිමවුමට, එහි ගුණාත්මක බව සහ මිල කෙරෙහි සෘජුවම බලපාන අතර එමගින් අවසානයේදි කුඩා වතු හිමියන් ලබන ආදායමටද බලපෑම් ඇති කරයි.

මෙම ගැටළු මඟ හරවා ගැනීමේ අරමුණින් පාසල් අධ්‍යාපනය අවසන් කල අ.පො.ස. (උසස් පෙළ)සුදුසුකම් සහිත 49 දෙනෙකු තෝරාගෙන ආධුනික තේ කර්මාන්තශාලා නිලධාරීන් පුහුණු කිරීමේ පාඨමාලාව ආයතනය විසින් ආරම්භ කරන ලදි. මෙය සත් මාසික පූර්ණ කාලීන වැඩසටහනක් වූ අතර කර්මාන්තශාලා තුළ ත්‍රෛමාසික ආයතනිකපුහුණුවකින්ද (කර්මාන්තශාලා පිළිබඳ පළපුරුද්ද/ හුරුව ලබා ගැනීමේ පාඨමාලාව) තේ නිෂ්පාදනය,අලෙවිකරණය, තේ වෙන්දේසි ක්‍රියාපටිපාටි, තේ රස බැලීම සහ කර්මාන්තශාලා ආරක්ෂාව සහ සනීපාරක්ෂාව ආදි පැතිකඩයන් ආවරණය වන පරිදි එක් මාසික දේශන සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම්ද, මනා කළමනාකාරිත්වයෙන් යුත් තෝරාගත් කර්මාන්තශාලා වල ත්‍රෛමාසික ප්‍රායෝගික පුහුණුවක්ද මීට ඇතුළත් වේ. සිසුන් 49 දෙනෙකුගෙන් ආරම්භ කලද ශිෂ්‍යාවන් දෙදෙනෙකුද ඇතුළත්ව 13 දෙනෙකුගෙන් මෙම පාඨමාලාව අවසන් විය. අනෙක් සිසුන්  පාඨමාලාව හැර ගියහ. එසේ වුවද රැඳී සිටි සියල්ලන් පාඨමාලාව ඉතා සාර්ථකව

සම්පූර්ණ කල අතර ඔවුන් සහකාර තේ කර්මාන්තශාලා නිලධාරීන් ලෙස අමු තේ දළු මිලදී ගන්නා කර්මාන්තශාලා වල රැකියාවන්හි නිරත වෙත.

අපගේ කාර්ය සාධනය සහ වැවිලි ක්ෂේත්‍රයේ නියුතු කුඩා වතු හිමියන් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම යන කාරණා ඇගයීමට ලක් කිරීමක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂය සඳහා කුඩා වතු හිමියන් වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීම උදෙසා රු. මිලියන 8 ක් වෙන් කොට ඇත. ඒ අනුව උතුරු නැගෙනහිර පළාත් ද ආවරණය වන අයුරින් තල් වැනි බෝග සඳහාද කුඩා වතු හිමියන් වෙනුවෙන් පාඨමාලා දියත් කිරීමට ආයතනය විසින් සැලසුම් කොට ඇත.

## 4.5 පුහුණු ක්‍රමවේදය

පාඨමාලාවන් හා සම්බන්ධ විචල්‍යයන් සැලකිල්ලට ගෙන අධ්‍යාපනික පාඨමාලා සහ පුහුණු සැසි පැවැත්වෙන ක්‍රමවේදය ප්‍රමිතිකරණය කොට ඇත. එක් එක් පාඨමාලාවට අදාල කාලය හා කාල රාමුව තිරණය කිරීමේදී පාඨමාලාවන්ට සහභාගී වන අයගේ මට්ටම, ඔවුන්ගේ තනතුර, රාජකාරී ස්ථානය සහ රාජකාරී නිවාඩු යනාදිය පිළිබඳ සැලකිල්ලට ගනු ලැබේ.වතු විධායකයින් සඳහා පැවැත්වෙන දිගු කාලීන පාඨමාලා මොඩියුල වශයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහිදී සමස්ත වැඩසටහන කොටස් කිහිපයකට බෙදා මොඩියුල ක්‍රමයට කඩින් කඩ පවත්වනු ලැබේ.දේශන සහ ප්‍රායෝගික සැසි පැවැත්වෙන දින තිරණය කිරීමේදී සහභාගිවන්නන් වතුවල රැඳී සිටිය යුතු දින ඉවත් කර ඇත. සාමාන්‍යයෙන් දිගු කාලීන පාඨමාලා වලදී එක් මසකට දින 06 ක් දේශන පැවැත්වුවද, ඒවා නොකඩවා පැවැත්වෙන්නේ නැත. පාඨමාලා සඳහා සහභාගී වන වතු විධායකයින්ගේ දෛනික වැඩ කටයුතු අදාල නොවන පරිදි බොහෝ විට පළමුවන සතියේ සිකුරාදා සහ සති අන්තයේද, තුන්වන සතියේ සිකුරාදා සහ සති අන්තයේද දේශන පැවැත්වේ. එහෙත් කුසලතා වර්ධන ආදි වූ වැඩසටහන් හා වෘත්තිය පරීක්ෂණ වලට අදාල වැඩසටහන් නොකඩවා දින 05 සිට 07 දක්වා පැවැත්වේ. නමුත් වතු කම්කරුවන් හා කුඩා වතු හිමියන් සඳහා වැඩමුළු පැවැත්වෙන කාලය බොහෝ විට එක් දිනකට (පැය 05 ක් හෝ 06 කට පමණ)සීමාකර ඇති අතර මෙම වැඩමුළු අදාල ප්‍රදේශයන් තුළ පවත්වනු ලැබේ.

පාඨමාලා පැවැත්වීමේදී ආයතනය විසින් නවීන පුහුණු ක්‍රමවේදයන් භාවිතයට ගනී. ඒවා අතර සාමූහික සාකච්ඡා, සාමූහික අභ්‍යාස, ආදර්ශන, සිද්ධි අධ්‍යයන, ක්ෂේත්‍ර චාරිකා, අත්දැකීම්භුවමාරු ක්‍රමවේදය සහ භූමිකා රංගන ආදිය ප්‍රධාන තැනක් ගනී.

ක්ෂේත්‍ර සහ කර්මාන්තශාලා සේවකයින් සඳහා වැඩි වශයෙන් භාවිතා වන්නේ ප්‍රායෝගික සැසි වේ. නමුත් අධ්‍යාපනික පාඨමාලා වලදී දේශන සඳහා වැඩි අවධානයක් යොමු කරන අතර, කම්කරුවන් හා කුඩා වතු හිමියන් සඳහා පැවැත්වෙන වැඩමුළු වලින් 80% ක් පමණ වැය කෙරෙන්නේ ප්‍රායෝගික සැසි සඳහාය. මෙවැනි ක්‍රමවේදයන් තුළින් කියවීමට සහ ශ්‍රවණය කිරීමට, ලිවීමට සහ අවධානය යොමු කිරීම සඳහා ඔවුන්ගේ පසුබෑම මඟහරවමින් ඔවුන් වැඩමුළුව සඳහා වඩාත් ඵලදායි ලෙස සහභාගි කර ගැනීම සිදුවේ.

විධායක ශ්‍රේණිය වෙනුවෙන් පවත්වනු ලබන කළමනාකරණ සංවර්ධන වැඩ සටහන් වලදී භූමිකා රංගන, සිද්ධි අධ්‍යයන, කළමනාකරණ ක්‍රීඩා සහ බුද්ධි කලම්බන සැසි වලට විශේෂ අවධානයක් යොමු වේ.

පසුගිය වර්ෂයන්හි ලත් අත්දැකීම් අනුව බල විට ආයතනයට ප්‍රමාණවත් පුහුණු කිරීමේ නිලධාරීන් සෑම විෂයක් සඳහාම බඳවා ගැනීම අපහසු වීමත් සහ පිරිවැය අධික වීමත් හේතුවෙන් බාහිර සම්පත්දායකයින් මත යැපීම වැඩි වූ අතර එය සුදුසු විකල්පයක් ලෙස සැලකිය හැකිය. සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය තුළ වූයේ ස්ථිර පුහුණු කිරීමේ සම්පත්දායකයින් 04 දෙනෙකු පමණි. එබැවින් තේ, රබර්, පොල් සහ උක් ආදී වූ බෝග පර්යේෂණ ආයතන වල විද්‍යාඥයින් හා දේශකවරුන් මෙන්ම විශ්ව විද්‍යාල ආචාර්යය/ මහාචාර්යවරුන් හා අත්දැකීම් සම්භාරයක් ඇති පළපුරුදු වතු පාලකයින් ආදීන්ගේ සහාය පාඨමාලා පැවැත්වීමේදී බාහිර සම්පත්දායකයින් ලෙස යොදා ගැනීමට ආයතනය විසින් පෙළඹුනි. කෙසේ වුවද, අධ්‍යාපනික හා අනෙකුත් පුහුණු පාඨමාලා සඳහා සම්පත්දායකයින්ගේ තෝරා ගැනීමේදී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, ආයතනික පළපුරුද්ද හා ඉගැන්වීමේ/ පුහුණු කිරීමේ හැකියාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලද.

## 4.6 වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව

වැවිලි කළමනාකරණ උපාධි පාඨමාලාව, වැවිලි ක්ෂේත්‍රයේ විශේෂයෙන් කුඩා වතු හිමියන්ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ සහ මැද පෙළ කළමනාකරුවන්ගේ කළමනාකරණ සහ තාක්ෂණසංවර්ධනය සඳහා නිර්මාණය කර ඇත.

2006 වර්ෂය වනතුරු වැවිලි ක්ෂේත්‍රය තුළ උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවක් නොතිබූ අතර ක්ෂේත්‍රයෙහි නියුතු වූවන්ට තම කළමනාකරණ සහ වෘත්තිමය හැකියාවන් ඩිප්ලෝමා මට්ටමට වඩා ඉහළ මට්ටමකට දියුණු කර ගැනීමේ අවශ්‍යතාවය පැන නැඟුනි. එබැවින් වැවිලි ක්ෂේත්‍රය තුළ ඇති වූ මෙම දැඩි අවශ්‍යතාවය සපුරාලිය යුතු විය. එසේම කළමනාකරුවන් වෘත්තිමය වශයෙන් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි මට්ටමට දියුණු කළ යුතු විය.

කර්මාන්තයේ ඵලදායිතාවය, ලාභදායිතාවය සහ එහි තිරසාරභාවයත් පිළිබඳ තහවුරු කර ගැනීම පිණිස මෙම අවශ්‍යතාවයේ හිඩැස පිරවිය යුතු විය. ඒ සඳහා වැවිලි ක්ෂේත්‍රයේ නිරත ජ්‍යෙෂ්ඨ සහ මැද පෙළ කළමනාකාරිත්වයට සූක්ෂම සහ සාර්ව මට්ටමින් විද්‍යාත්මක, න්‍යායාත්මක සහ කළමනාකාරිත්ව ප්‍රවීණත්වය ලබාදිය යුතු විය. මෙම අවශ්‍යතාවය සැපිරීම උදෙසා සර්ව සම්පූර්ණ, සවිස්තරාත්මක අධ්‍යාපන පාඨමාලාවක් සකස් කල යුතු විය. ඒ අනුව මෙම අඩුව පිරවීම සඳහා දරණ ලද ප්‍රයත්නයෙහි ප්‍රතිඵලයක් ලෙස 2006 වර්ෂයේදී වයඹ විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයවිද්‍යාවේදී වැවිලි කළමනාකරණ උපාධි පාඨමාලාව හඳුන්වා දෙන ලදී. මෙය වසර 03 ක දුරස්ථ අධ්‍යාපන පාඨමාලාවක් විය. ආරම්භයේදී වැවිලි විධායකයින් 21 දෙනෙකු මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ අතර 2008 වර්ෂයේදී 17 දෙනෙකු සාර්ථක ලෙස උපාධිය අවසන් කරන ලදී. සෑම වර්ෂයකම ලියාපදිංචි වූ සිසුන් ගණන සහ උපාධිය සාර්ථක ලෙස අවසන් කල සිසුන් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

| <u>*වර්ෂය*</u> | <u>*ලියාපදිංචි වූ සංඛ්‍යාව*</u> | | <u>*සාර්ථකව නිමා කල සංඛ්‍යාව*</u> |
|---|---|---|---|
| 2006 | 21 | | 17 |
| 2007 | 17 | | 11 |
| 2008 | 35 | | 21 |
| 2009 | 34 | අවසන් කිරිමට නියමිත | |
| 2010 | 47 | | |
| 2011 | 32 | සම්පූර්ණ කිරිමට නියමිත | |
| 2012 | 54 | | |
| 2013 | 87 | | |




2009 සහ 2010 කණ්ඩායම් වල ප්‍රතිඵල අවසන් වීමට නියමිතව ඇති අතර 2013 වර්ෂයේදි සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් සිසුන් 116 ක් අතුරින් 87 දෙනෙකු උපාධිය හැදෑරීමට සුදුසුකම් ලැබූහ. ඉහත සඳහන් ප්‍රස්ථාරයටඅනුව විද්‍යාවේදි වැව්ලි කළමනාකරණ උපාධිය සඳහා තිබෙන ඉල්ලුම සැලකිය යුතු ලෙස ධනාත්මකව වැඩිවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි. සාර්ථකව උපාධිය අවසන් කරන අයදුම්කරුවන් සඳහා සහතික පත්‍රය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය හා වයඹ විශ්ව විද්‍යාලය ඒකාබද්ධව පිරිනමනු ලබයි. මේ අනුව වයඹ විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව උපාධි පාඨමාලාවක් පිරිනැමීමට ලැබීම ආයතනය ලද මහත් ගෞරවයකි.






SRI LANKA

## 4.7 උපදේශන සේවා

වැවිලි කළමනාකරණයට සම්බන්ධ විවිධ විෂයන්ට අදාලව උපදේශන සේවා සැපයීම ජාතික වැවිලිකළමනාකරණ ආයතනයේ එක් පරමාර්ථයකි. 1987 වසරේ සිට විවිධ රාජ්‍ය හා පෞද්ගලික අංශ වලට ආයතනය මෙම සේවාව සපයනු ලැබේ.2012 වර්ෂයේදී පහත විස්තර සපයා ඇති පරිදි විවිධ ආයතන වල බඳවා ගැනීම් සහ උසස් කිරීම් සඳහා විභාග 11 ක් පවත්වා ඇත.

| ආයතනය | විභාග සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව | ඉපයූ ආදායම (රු.) |
|---|---|---|---|
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 05 | 260 | 209,095.00 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 03 | 247 | 228,751.10 |
| පොල් පර්යේෂණ ආයතනය | 03 | 206 | 92,737.50 |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 01 | 83 | 198,379.75 |
| **මුළු එකතුව** | **11** | **796** | **728,963.35** |

## 4.8 පුස්තකාල පහසුකම්



ආයතනයේ පුස්තකාලය වැවිලි කළමනාකරණයට සම්බන්ධ තේ, රබර්, පොල්, උක්, කජු, ගිණුම්කරණය, පොදු කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, ධනාත්මක චින්තනය, කාල කළමනාකරණය, ඵලදායිතාවය, කර්මාන්ත සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය, තත්ත්ව කළමනාකරණය වැනි විෂයන්ට අදාල පොත් 6,000 කින් පමණ සමන්විත වේ.

මෙහි බැහැර දීමේ හා විමර්ශනය කිරීමේ අංශ දෙකම ඇත. දිගු කාලීන අධ්‍යාපනික පාඨමාලා හදාරන අයට හා ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට පුස්තකාලයේ පොත පත පරිහරණය කල හැකි අතර කෙටි කාලීන වැඩසටහන් සඳහා සහභාගී වන අයට, බාහිර සම්පත්දායකයින්ට සහ මෙම ප්‍රදේශයේ පාසල් සිසුන්ට විමර්ශන අංශය පරිහරණය කල හැක.

## 4.9 ආයතනිය වෘත්තීය සාමාජිකත්වය

1987 අංක 05 දරණ පනතෙහි සඳහන් කොන්දේසි සහ නිර්ණායක වලට අනුකූලව සුදුසුකම් ලත් වැවිලි විධායකයින් සඳහා ආයතනිය වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම මේ වර්ෂය තුළදී ද පවත්වා ගෙන යන ලදි. පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද කමිටුවක් විසින් කරන ලද අයදුම්පත් අධීක්ෂණය යටතේ අයදුම්කරුවන් 07 දෙනෙකු හඳුනා ගෙන 2012 වර්ෂයේදී සාමාජිකත්වය පිරිනැමීමට තිරණය කල අතර, ඒ අනුව එකී වර්ෂයේදී මුළු සාමාජිකත්වය පහත පරිදි වේ.

ගරු සාමාජිකයින් - 20

පූර්ණ සාමාජිකයින් - 198

| | | |
|---|---|---|
| ආශ්‍රිත සාමාජිකයින් | - | 18 |
| ශිෂ්‍ය සාමාජිකයින් | - | 02 |
| **මුළු ගණන** | - | **238** |

අදාල අවශ්‍යතා සපුරා තිබූ බැවින් ආශ්‍රිත සාමාජිකයින් දෙදෙනෙකු පූර්ණ සාමාජිකයින් බවට උසස් කරන ලදි.

## 4.10 ප්‍රකාශන

මීට ඉහත වසර වලදී සිදු කල පරිදි ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ද, වැවිලි කළමනාකරණය පිළිබඳ සඟරාවෙහි වාරික 02 ක් සහ ත්‍රෛමාසික පුවත් ලිපිය නිකුත් කරන ලදි.

බෝග පර්යේෂණ ආයතන වල පර්යේෂකයින්, විශ්ව විද්‍යාල වල දේශකවරුන් සහ පළපුරුදු දක්ෂ වතු පාලකයින් විසින් සකස් කරන ලද ලිපි වලින් මෙම සඟරාව සමන්විත විය. කතුවරුන්ගේ වර්ණ ඡායාරූප සහ වෙනත් අදාල වර්ණ ඡායාරූපඇතුළත් කොට ආයතනයේ සඟරාව වෙනත් මුහුණුවරකින් ඉදිරිපත් කොට ඇත.මෙහි සංස්කාරක මණ්ඩලය, වයඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය එස්.ජේ.බී.ඒ. ජයසේකර මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ අංශයේ මහාචාර්ය කේ.බී.එම්. ෆොන්සේකා මහතා, රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ගාමිණී සෙනෙවිරත්න මහතා, පොල් පර්යේෂණ ආයතනයේ ශාක විද්‍යා අංශයේ අංශ ප්‍රධානිආචාර්ය එන්. රණසිංහ මහතා සහ තේ පර්යේෂණ ආයතනයේ උපදේශක අංශයේ අංශ ප්‍රධානී බී.ඒ.ඩී. සමන්සිරි මහතා යන අයගෙන් සමන්විත විය. ප්‍රධාන සංස්කාරක වූයේ රබර් පර්යේෂණ ආයතනයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එන්. යෝගරත්නම් මහතාය. මෙම සඟරාවේ වැඩි දියුණු වූ තත්ත්වය නිසා වැවිලික්ෂෙත්‍රයේ සහ වෙනත් විධායකයින්ගෙන් මෙම සඟරාව සඳහා විශාල ඉල්ලුමක් පැවතුනි. සඟරාව විකිණීම තුළින් සමාලෝචිත වර්ෂයේදී රු. 42,000/- ක මුදලක් ලැබුණු අතර, ආචාර්යයෝගරත්නම් මහතා විසින් සංස්කරණය කරන ලද පුවත් ලිපිය ආයතනයේ පාර්ශවකරුවන් අතර නොමිලේ බෙදා හරින ලදි. මෙම සඟරාවේ පිටපත් විශ්ව විද්‍යාල පුස්තකාල, බෝග පර්යේෂණ ආයතන, බ්‍රෝකර් ආයතන සහ වැවිලි අංශයට අයත් අනෙකුත් ආයතන වලට නොමිලේ බෙදා දෙන ලදි.

## 4.11 ආයතනය තුල ඇති පහසුකම්

ඉහළ නැංවීම සහ නවීකරණය කිරීම තුළින් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ දේශීය හා විදේශීය වෙළඳපොලට අවශ්‍ය පරිදි උසස් තත්ත්වයෙන් ක්‍රියාත්මක වන පුහුණු කිරීමේ ආයතනයක් සතුවතිබිය යුතු සියලුම යටිතල පහසුකම් ආයතනය සතු විය. අතුරුගිරියෙහි පිහිටි එහි ප්‍රධාන කාර්යාලය තුල වායු සමනය කරන ලද දේශන ශාලා 03 ක්, තත්ත්වය ඉහළ නැංවිය යුතු මුද්‍රණ අංශයක්, එක් වරකට 200 දෙනෙකුට පමණ ආසන පහසුකම් සැපයිය හැකි විශාල ශ්‍රවණාගාරයක්, 6,000 කට වැඩි පොත් සංචිතයක් ඇති පුස්තකාලයක්, එක් වරකට 60 දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයක්, කාර්යාල සංකීර්ණයක්සහ අනෙකුත් සියලු යටිතල පහසුකම් තිබිණි. ආයතන පරිශ්‍රය තුළ කාර්ය මණ්ඩලය සඳහා ඇති නිල නිවාස 05 ට අමතරව අධ්‍යක්ෂ සඳහා ප්‍රතිසංස්කරණය කල යුතු වූ නිල නිවාසයක් තිබුණි. 2011 වර්ෂයේදී වාහන 08 ක් තිබූ අතර ඉන්

02 ක් අවුරුදු 20 කට හා 04 ක්අවුරුදු 10 කට වඩා පැරණිය. අවුරුදු 20 ට වඩා පැරණි වාහන 02 විකුණු අතර, එම අවුරුද්දේදීම අළුත් වාහන 02 ක් මිලදී ගන්නා ලදි. කෙසේ වෙතත් සංයුක්ත සැලැස්ම තුළඅන්තර්ගත සියලු වැඩ කටයුතු ඉටු කිරීම සඳහා මෙම ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් වන්නේ නැත. දැනට අබලන් තත්ත්වයේ පවතින වාහන 04 ක් 2013 වර්ෂයේදී විකිණීමට බලාපොරොත්තු වේ.

අබලන් තත්ත්වයේ පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය පිළිසකර කිරීම සඳහා 2011 වර්ෂයේදී පිළිගත් ක්‍රමවේදයන්ට අනුව ලංසු කැඳවා කොන්ත්‍රාත්තුවක් පිරිනැමුවද අදාල කොන්ත්‍රාත්කරුවිසින් එකී කටයුතු අතරමඟ නවතා දමන ලදි. මේ හේතුවෙන් අභ්‍යන්තර මාර්ග පද්ධතිය පිළිසකර කිරීම 2012 වසරට කල් දැමීමට සිදු විය. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරිය විවිධ පියවරයන් වලදී විවිධ ඇස්තමේන්තු ඉදිරිපත් කල බැවින් 2012 වසරේදී ද එය නිම කිරීමට නොහැකි විය. එබැවින් අඩුම මිල ගණන් වලට එකඟ වෙමින්මාර්ග සංවර්ධන අධිකාරිය සමග 2013 පළමු කාර්තුවේදී එම කාර්යය ඉටු කිරීමට කටයුතු යොදා ඇත.වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමියගේ කාරුණික මැදිහත් වීම නිසා මෙම කාර්යය ඉටු කර ගැනීමට හැකි විය.

සභාපති කාර්යාල ගොඩනැඟිල්ල, අධ්‍යක්ෂවරයා සිටින කාර්යාල ගොඩනැඟිල්ල සහ පරිපාලන අංශය ඇති ගොඩනැඟිල්ල ඉතා පැරණි අතර අලුත්වැඩියා කල නොහැකි තත්ත්වයේ පවතී. අතුරුගිරියේ පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල මීට වසර 50 කට පෙර ගොඩනැඟූ කාර්යාල සංකීර්ණයකට පරිවර්තනය කරන ලද ගව මඩුවක. එබැවින් පරිපාලන අංශය සඳහා පරිසර හිතකාමී ගොඩනැඟිල්ලක් ඉදිකිරීම හදිසි අවශ්‍යතාවයකි. දැනට භාවිතා නොකරන ගොඩනැඟිලි ආයතන පරිශ්‍රය තුළ නොමැත. කොරියානු රැකියා අපේක්ෂා කරන්නන් සඳහා පැවැත්වෙන පුහුණු පාඨමාලා වලට නේවාසික පහසුකම් සපයන බැවින් ආයතනයේ සියලු ගොඩනැඟිලි භාවිතයට ගැනේ.

ආයතනයට අයත් බගවන්තලාව තෙරේසියා වත්තෙහි පිහිටි ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය සතුවද පුහුණු ආයතනයකට අවශ්‍ය සියලු පහසුකම් තිබේ. ශ්‍රවණාගාරයෙහි වරකට 60 දෙනෙකු සඳහා පහසුකම් සැපයිය හැකි අතර, මධ්‍යම පරිමාණයේ දේශන ශාලා දෙකෙහි 100 දෙනෙකුට පමණ වාඩිවීමේ පහසුකම් ඇත.එමෙන්ම 70 දෙනෙකුට පමණ නවාතැන් පහසුකම් සැපයිය හැකි අතර, විශාල ප්‍රමාණයේ භෝජන ශාලාවක්, කාර්යාල කාමර 03 ක්, පොත් 600 කින් පමණ සමන්වත කුඩා ප්‍රමාණයේ පුස්තකාලයක්, නේවාසිකාගාර කළමනාකරු සඳහා නවාතැන් පහසුකම් සහ 10 දෙනෙකුට පමණ එකවර නවාතැන් ගත හැකි සංචාරක බංගලාවක් තිබේ.මෙම ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙහි භාරකරු නේවාසිකාගාරයේ කළමනාකරු වේ. ඔහු හැර කිසිදු ස්ථිර සේවකයෙකු මෙහි නැත. එබැවින් අවශ්‍ය අවස්ථා වලදී පමණක් අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ඇතිව දෛනික කුලී පදනම මත කම්කරුවන් සේවයට බඳවා ගනී.එමෙන්ම අනියම් පදනම මත සේවකයින් දෙදෙනෙකු මුරකරුවන් ලෙස බඳවා ගෙන ඇත. වර්තමානයෙහි මෙහි නවාතැන් පහසුකම් කොරියානු රැකියාඅභ්‍යාසලාභීන් සඳහා සපයා දී ඇත.

පුහුණු වැඩසටහන් වලට පැමිණෙන අය සඳහා නේවාසික හා අනෙකුත් සියලු පහසුකම් ලබාදීමේ වගකීම නේවාසිකාගාර කළමනාකරු වෙත පැවරේ. ඔහු වෙත රු. 15,000/- ක මුදල් අග්‍රිමයක් ලබා දී ඇත. නේවාසිකාගාර කළමනාකරුගේ වගකීම් අතර මධ්‍යස්ථානය නිසි පරිදි පවත්වාගෙන යාම,





කම්කරුවන්ගේ පැමිණීමේ වාර්තා තබා ගැනීම, ඔවුන්ගේ වැටුප් නිර්දේශ කිරීම, පුහුණු වැඩසටහන් වලට අදාල ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම හා පිළියෙල කර දීම ආදී කටයුතු වැදගත් තැනක් ගනී.



## 4.12 2013 වර්ෂය සඳහා කාර්ය දර්ශනය

ඉදිරි වර්ෂය සඳහා කාර්ය දර්ශන සකස් කිරීමේදී ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් සමග සාකච්ඡා කිරීම ආයතනික ප්‍රතිපත්තියක් ලෙස සෑම වර්ෂයකම සිදු කරනු ලබයි. එම සාකච්ඡා වටයට අපගේ ආරාධනයෙන් බෝග පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සහ වැවිලි ක්ෂෙත්‍රය සමග සෘජු සම්බන්ධතාවයක් සහිත අනෙකුත් ආයතන මෙන්ම කුඩා වතු හිමියන් නියෝජනය කරමින් පාර්ශවකරුවන් සහභාගි වෙත.

නමුත් 2013 වර්ෂය සඳහා කාර්ය දර්ශනය සකස් කිරීමේදී එවැනි සාකච්ඡා වටයක් පාර්ශවකරුවන් සමග නොපැවැත්වුණු අතර, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ බෝග වගාව සහ නිෂ්පාදන භාවිතයන් පිළිබඳ වැඩසටහන් සඳහා පාර්ශවකරුවන්ගේ අදහස් පිළිබඳව අවධානය යොමු කිරීමක් සිදු කල අතර ඒ හැරුණු කොට එතෙක් පැවති කාර්ය දර්ශනයෙහි විශාල වෙනස්කම් සිදු නොකිරීමට තිරණය විය.

කෙසේ වුවද 2013 වර්ෂය සඳහා කාර්ය දර්ශන සකස් කිරීමේදී 2011 සහ 2012 වර්ෂයන්හි මෙම ආයතනයෙහි පාඨමාලාවන් හැදෑරූ අයගේ සහ අභ්‍යන්තර හා බාහිර සම්පත්දායකයන්ගේ අදහස් සහ යෝජනා සැළකිල්ලට ගන්නා ලදි. එම අදහස් සහ යෝජනා මත පදනම්ව වෘත්තිය වැඩසටහන් සහ කුඩා වතු හිමියන් සඳහා වූ වැඩසටහන් කිහිපයක් 2013 වර්ෂය සඳහා වූ කාර්ය දර්ශනයට ඇතුළත් කරන ලදි. ඒ අනුව 2013 වර්ෂය සඳහා වූ කාර්ය දර්ශනයට අදාල වැඩසටහන් පහත පරිදි වේ.

- අධ්‍යාපනික/ වෘත්තිය වැඩසටහන් - 17
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන් - 05
- කුසලතා සංවර්ධන වැඩසටහන් - 06
- ප්‍රාරම්භක පාඨමාලාවන් - 02

**ඉල්ලුමට අනුකූලව සැපයීමට නියමිත වැඩසටහන්**

- තාක්ෂණික සංවර්ධන වැඩසටහන් - 13
- කම්කරු සංවර්ධන වැඩසටහන් - 10

මීට අමතරව ආයතනය විසින් උපයාගත් මුදලින් සහ මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන වලින් පහත සඳහන් පුහුණු වැඩසටහන් කුඩා වතු හිමියන් සඳහා පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

- කුඩා තේ වතු හිමියන් සඳහා - 60
- කුඩා රබර් වතු හිමියන් සඳහා - 50
- කුඩා පොල් වතු හිමියන් සඳහා - 50
- කුඩා උක් වතු හිමියන් සඳහා - 10
- කුඩා කජු වතු හිමියන් සඳහා - 10
- කුඩා තල් වතු හිමියන් සඳහා - 10
- කුඩා කුරුඳු වතු හිමියන් සඳහා - 10

**200**

ඒ අනුව 2013 වර්ෂයේදී අවම වශයෙන් වැඩසටහන් 253 ක් පැවැත්වීම ආයතනයේ අරමුණ වේ.

## 4.13 පුහුණු වැඩසටහන් වල නව පැතිකඩයන්

2013 කාර්ය දර්ශනයෙහි ඇතුළත් වැඩ සටහන් වලට අමතරව වැවිලි ක්ෂෙත්‍රයටසම්බන්ධ විවිධ පුද්ගල කණ්ඩායම් ඉලක්ක කොට ගත් නව වැඩ සටහන් සැලසුම් කිරීමට සහ සැකසීමට අවශ්‍ය කටයුතු 2013 වර්ෂය ආරම්භයේදී පහත පරිදි සිදු කිරීමටද නියමිතය. මෙම වැඩසටහන් වල ප්‍රධාන පරමාර්ථය වනුයේ ක්ෂෙත්‍ර/ කර්මාන්තශාලා නිලධාරින් හට උසස් අධ්‍යාපනය ලැබීම සඳහා අවස්ථාව සලසා දීමය.

(අ) අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද සහිත,විශේෂයෙන්ම තේ ක්ෂෙත්‍ර නිලධාරීන් සඳහා තේ වගාව පිළිබඳ නව ඩිප්ලෝමා පාඨමාලාවක් සැකසීම.

(ආ) තේ කර්මාන්තශාලා කළමනාකරණයෙහි අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිත තේ කර්මාන්තශාලා නිලධාරීන් සඳහා තේ නිෂ්පාදනය සහ කර්මාන්තශාලා කළමනාකරණය පිළිබඳ නව ඩිප්ලෝමා පාඨමාලාවක් සැලසුම් කිරීම.

(ඇ) දැනට පවතින ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාපාඨමාලාව,එය හදාරන්නන්ගේ දෛනික වැවිලික්ෂෙත්‍රයේ කටයුතු වලට බාධාවක් නොවන ලෙස කරගෙනයාමට අවස්ථාව සලසා දීම සඳහා, එම පාඨමාලාව දුරස්ථ ඉගෙනුම්පාඨමාලාවක් ලෙස පැවැත්වීම.ඒ සඳහා අවශ්‍ය මොඩියුල සැකසීම මේ වන විට තෝරාගත් මොඩියුල රචකයන් මගින් සිදු කෙරෙන අතර ඔවුන් වෙනුවෙන් මොඩියුල රචනය පිළිබඳ අවශ්‍ය පුහුණුවද නාවල විවෘතවිශ්ව විද්‍යාලයේ නිලධාරීන්ගේ සහය ලබා ගනිමින් සිදු කිරීමට අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කරන ලදී.

(ඇ) විදේශීය සිසුන් සඳහා තේ සහ රබර් වගා කිරීම සහ නිෂ්පාදනය පිළිබඳව ක්‍රමවත් පාඨමාලාවන් කිහිපයක් සැකසීම.මෙහිදී ආයතනයේ සේවාවන් මෙම පාඨමාලා පිළිබඳ උනන්දුවක් දක්වන විදේශීය රටවල් දක්වා පුළුල් කිරීම සහ ව්‍යාප්ත කිරීම අරමුණු කරන අතර එමගින් ආයතනයේ උපයාගත් ආදායම වැඩි කිරීමද අරමුණු වේ. සහකාර අධ්‍යක්ෂ

පාලන තනතුර වුවද 2011 දෙසැම්බර් මාසයේදී දෙවන වරටත් දැන්වීම් පල කිරීමෙන් පසු පුරප්පාඩු පුරවන ලදී.



## 5.0 පරිපාලන අංශය

ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පාලන) පරිපාලන අංශ ප්‍රධානි ලෙස කටයුතු කරන ලදී. 2012 වර්ෂයට අදාලඅනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 39 කි. එහෙත් සමාලෝචිත වර්ෂය තුලදී මෙම තනතුරු වලින්කීපයක් පිරවීමට නොහැකි විය. එයට හේතු වූයේ එම තනතුරු සඳහා ඉහල සුදුසුකම් ඉල්ලා තිබීමත් බඳවා ගැනීමේ පටිපාටිය (SOR)මඟින් ලබා දී ඇති වැටුප තරඟකාරීව එම තනතුරු සඳහා ප්‍රමාණවත් නොවීමත්ය. පුහුණු කිරීමේ නිලධාරී (ගිණුම් හා මූල්‍ය කළමනාකරණය) සහ නේවාසිකාගාර කළමනාකරු තනතුරු සඳහා තෙවරක් අයදුම්පත් කැඳවන ලදී. ඒ සඳහා ප්‍රතිචාර ඉතාමත් පහල මට්ටමක පැවතුන අතර එහිදී සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් අපේක්ෂාකල වැටුප ආයතනය මඟින් එකඟ නොවීම හේතුවෙන් එම තනතුරු සඳහා පත්වීම ඔවුන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. නව බඳවා ගැනීම් පටිපාටියට (SOR)අනුව බඳවා ගනු ලබන ඕනෑම අයෙකුගේ සුදුසුකම් සහ අත්දැකීම් නොතකා ආරම්භක වැටුප් තලයේ තැබිය යුතු බව පැහැදිලිව දක්වා ඇත. සුදුසුකම්ලත් සේවකයින් ආයතනයට බඳවා ගැනීමේදී මෙම කොන්දේසිය බාධාවක්ව පවතින අතර මෙම පුරප්පාඩු පිරවීමේදී ආයතනයට විශාල පිරිවැයක් දැරීමට සිදු වේ. වැටුප් හා සංඛ්‍යා ලේඛන කොමිසම වෙත ඉදිරිපත් කරන ලදයෝජනාවෙහි පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික), පුහුණු කිරීමේ විශේෂඥ (සමාජ සංවර්ධන), සහකාර ගණකාධිකාරී, නේවාසිකාගාරය සඳහා කෝකියෙකු, බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය සඳහා මුරකරුවෙකු වැනි ඉතා වැදගත් තනතුරු කිහිපයක්ම ඇතුලත් විය. නමුත් එවකට ආයතනයේ මෙහෙයුම් කටයුතු සලකා බැලීමෙන් පසුවවැටුප් හා සංඛ්‍යා ලේඛන කොමිසම විසින් එම තනතුරු අනුමත නොකරන ලද වුවද ඒ පිළිබඳව වර්තමානයේ නැවත සලකා බැලිය යුතුය.

2011 වසර හා සසඳන කල සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ක්‍රියාකාරකම් වල පැහැදිලිවර්ධනයක් දක්නට ලැබුණි. ඒ තුලින් වඩාත් කැපී පෙනෙන්නේ කුඩා වතු හිමියන් සඳහා පවත්වන ලදපුහුණු වැඩ සටහන් වේ. මෙම වැඩසටහන් පැවැත්වෙන්නේ කුඩා වතු හිමියන් සිටින ප්‍රදේශ වලදීය.ඊට අමතරව උතුර, නැගෙනහිර පළාත් වලද කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩ සටහන්පැවැත්විණි. මෙම

කටයුතු නිසා ආයතනයේ පරිපාලන හා මූල්‍ය අංශ වලද කටයුතු වර්ධනය වීතිබේ. එසේ හෙයින් යාවත්කාලීන කරන ලද 2013 - 2017 සඳහා සංයුක්ත සැලැස්ම තුල පහත සඳහන් තනතුරු අළුතින්ඇති කිරීමට බලාපොරොත්තු වේ.

- ප්‍රසම්පාදන නිලධාරී - (01)
- අභ්‍යන්තර විගණක - (01)
- සහකාර ගණකාධිකාරී - (01)
- රියදුරු - (02)
- සභාපතිගේ පෞද්ගලික සහකාර - (01)
- අභ්‍යන්තර විගණක සඳහා කළමනාකරණ සහකාර - (01)
- නේවාසිකාගාර සහකරු - (01)
- උද්‍යාන කම්කරු - (02)
- මුරකරු - (02)
- කෝකියන් - (02)

වර්තමානයෙහි ප්‍රසම්පාදන කටයුතු කිරීමට වෙනම නිලධාරියෙකු නැත. එම කටයුතු සිදු කෙරෙන්නේඅවිධිමත් පිළිවෙලකටය. ඇතැම් විට ගබඩා පාලක විසින් මිලදී ගැනීම් සිදුවෙන අතර, සමහරක්අවස්ථා වලදී වැඩ පරික්ෂක විසින් එම කටයුතු ඉටු කරනු ලබයි. මෙම අවිධිමත් පිළිවෙල නතර කරන ලෙසටවිගණකවිසින්ද ආයතනයට උපදෙස් දී ඇති අතර ආයතනය සඳහාඅභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු බව රජයේ විගණක විසින්ද පෙන්වා දී ඇත. වර්තමානයේදී අභ්‍යන්තර විගණන කටයුතු සිදු කෙරෙන්නේඅමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසිනි. ඔහුද වැඩ අධික පුද්ගලයෙකු බැවින් මෙම කටයුතුනිසිපරිදි සිදුනොවෙන අතරම ප්‍රමාදයන්ද පවතී. මේ හේතු නිසා ප්‍රසම්පාදන නිලධාරී තනතුර හා අභ්‍යන්තර විගණක තනතුරඇති කිරීමට යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මෙහි යෝජනා කර ඇත.

දැනට ප්‍රධාන කාර්යාලයේ නේවාසිකාගාරය සඳහා නේවාසිකාගාර කළමනාකරුවෙකු නොමැතිබැවින්, එකී කටයුතු ආවරණය කරනු ලබන්නේ වැඩ පරික්ෂක විසිනි. අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදීගැනීමේ කාර්ය මාස 06 ක කාලයක් සඳහා පත්කර ඇති කළමනාකාර සහකාරවරුන්ගෙන් සමන්විතකමිටුවකින් සිදු කෙරෙන අතර එමගින් එම කටයුතු වල වඩාත් කාර්යක්ෂම හා විනිවිද භාවය සහතික වේ. අතුරුගිරියේ සහ බගවන්තලාවේ පිහිටි නේවාසිකාගාර දෙකවිසින් පුහුණු වැඩ සටහන් සඳහා නේවාසික පහසුකම් හා ආහාර පාන යනාදිය සපයනු ලබයි. මෙහිපැවැත්වෙන බාහිර පුහුණු වැඩසටහන් සඳහා එක් අයෙකුගෙන් එක් දිනකට ආහාර සඳහා රු. 850/-ක මුදලක් අය කෙරෙන අතර, නවාතැන් ගාස්තු සඳහා රු. 250/- ක් අයකෙරේ. මෙම ගාස්තු හුදෙක්අදාල පහසුකම් සඳහා පිරිවැය ආවරණය කර ගැනීම සඳහා පමණි. කෙසේ වෙතත්, මෙමමධ්‍යස්ථාන වලින් සැපයෙන ආහාර සහ නවාතැන් පහසුකම් පිළිබඳව එකී පහසුකම් ලබාගත් අයවිසින් ප්‍රසංශාත්මකව කතා කරනු ලබයි. මෙම පහසුකම් වල තත්වය තව දුරටත් දියුණු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

සමාලෝචිත වර්ෂය තුලදීද ආයතනය විසින් කොරියානු රැකියා අපේක්ෂකයන් සඳහා පහසුකම් සැපයීම සිදු කරන ලදි. මෙම තත්වය මත ස්ථිරකාර්ය මණ්ඩලයට අමතරව කළමනාකාර සහකාරවරුන් 06 දෙනෙකු සහ කාර්යාල සහයකවරුන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත අලුතින් බඳවා ගැනීමට ආයතනයට සිදු විය. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලදඅතර නව තනතුරු සඳහා වැටුප් ගෙවීම් කොරියානු වැඩ සටහන් මඟින් උපයා ගත් ආදායමෙන් ගෙවීමට කටයුතු සිදු කරන ලදි.

ශ්‍රී ලංකා හමුදාවේ කඳවුරක් ඉදිකිරීම සඳහා ඔවුන්ගේ ඉල්ලීමකට අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාගේ උපදෙස් සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත ආයතනයට අයත් අක්කර 4 1/2 ක් වු හිස් ඉඩමක් කාර්ය මණ්ඩල නිල නිවාස 03 ක් ඇතුලත්වශ්‍රී ලංකා හමුදාවට ලබා දීමට කටයුතු කරන ලදි. මෙම දේපල තක්සේරු කිරීමේ කටයුතු තක්සේරු කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදි. එය රු. මිලියන 55.0 ක් ලෙස තක්සේරු කරන ලද අතර එම මුදල ආයතනයට ගෙවීම සඳහා මේ වන විට කටයුතු සිදු වෙමින් පවතී. ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමාගේ උපදෙස් සහ මඟ පෙන්වීම මත, එම මුදල් මඟින් විශේෂයෙන්ම කුඩා වතු හිමියන් සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ගාල්ල, කුරුණෑගලසහ රත්නපුර යන ප්‍රදේශයන්හි මෙම ආයතනයෙහි ප්‍රාදේශිය කාර්යාලයන් පිහිටුවීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම දැනට පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ ආයතනය මඟින් ලබා දෙන්න වු පහසුකම් සහ සේවාවන් වැඩි දියුණු කිරීමත් අපේක්ෂිතය.

## 6. <u>ගිණුම් අංශය</u>

ගිණුම් අංශ ප්‍රධානී වශයෙන් ගණකාධිකාරි සේවයේ යෙදී සිටී. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු අනුමත කිරීමේදී ගණකාධිකාරි තනතුර කණිෂ්ඨ කළමනාකරණ තනතුරේ සිට මධ්‍යම ශ්‍රේණියේ කළමනාකරණ තනතුර දක්වා උසස් කර ඇත. ඒ අනුව කණිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණියේ සේවය කරන ලද එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතාගේ කාර්ය සාධනය, සේවා නිපුනත්වය, සුදුසුකම් සහ පලපුරුද්ද සැලකිල්ලට ගෙන ආයතනයේ පාලක මණ්ඩලය විසින් ඔහුගේ තනතුර මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිය දක්වා උසස් කිරීම අනුමත කර ඇත. මෙම හේතුවෙන් එකම තනතුර සඳහා මට්ටම් දෙකක සේවකයන් දෙදෙනෙකු සිටීමෙන් ඇති වන අනවශ්‍ය පිරිවැයමගහරවා ගැනීමට හැකි වීම මඟින් ප්‍රතිලාභයක් අත්වී ඇත.

පසුගිය වසරේ පරිදි ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා වෙනම නිලධාරීන් ආයතනයේ නොසිටි අතර ඒ සඳහා සුදුසු කිසිදු පුද්ගලයෙක්ද ආයතනයේ නොසිටියේය. එම නිසා ප්‍රසම්පාදන කටයුතු තත්කාලිනව සිදු කරන ලදි. ඒ අනුව ප්‍රසම්පාදන සැලසුම් සැකසීම, ලංසු ලියවිලි සැකසීම සහ ලංසු කැඳවීම යනාදිය පරිපාලන අංශය විසින් සිදු කල අතර ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු ප්‍රදානය, ගිවිසුම් අත්සන් කිරීම, ගෙවීම් කටයුතු සිදු කිරීම සහ අධික්ෂණ කටයුතු ආදිය ගිණුම් අංශය විසින් අධ්‍යක්ෂතුමාගේ අධික්ෂණය යටතේ සිදු කරන ලදි. මෙම තත්කාර්ය යාන්ත්‍රනය ආයතනයසඳහා සුදුසු නොවන හෙයින් ස්ථිර වශයෙන් ප්‍රසම්පාදන නිලධාරි තනතුර යාවත්කාලින කරන ලද සංයුක්ත

සැලැස්මෙහි අවධාරණය කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම පත් කිරීම පිළිබඳ අනුමැතිය ලබා දෙනු ඇතැයි ආයතනය බලාපොරොත්තු වේ.

ආයතනයේ අභ්‍යන්තර විගණක නිලධාරීවරයෙකු වර්තමානයේදී නොසිටියි. ආයතනය විසින් නව කාර්ය මණ්ඩල අනුමැතිය සඳහා ඉල්ලීම් කරන අවස්ථාවේදී අභ්‍යන්තර විගණක තනතුර එහි ඇතුලත් වුවද එය අනුමත නොවිය. එම හේතුවෙන් අභ්‍යන්තර විගණකගේ කාර්ය භාරය වැවිලි අමාත්‍යාංශයේ අභ්‍යන්තරවිගණක විසින් සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලදි. එම හේතුවෙන් ආයතනයේ යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මේ අභ්‍යන්තර විගණකගේ තනතුර ඇතුලත් කිරීම සඳහා යෝජනා කර ඇත.

සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලි. 1.65 ක් වැය කර බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අළුත්වැඩියාවන්, සේවක නිල නිවාසයන්ට ජලය සැපයීම, අතුරුගිරිය නේවාසිකාගාර ගොඩනැගිල්ලේ පහළ වාහන නැවතුම්පල පිලිසකර කර කොරියානු පුහුණු වැඩ සටහන් සඳහා සහභාගීවන්නන්ට ආපන ශාලා පහසුකම් සලසා දීම වැනි කාර්යයන් සිදු කරන ලදි. 2012 වර්ෂය තුලදී රු.මිලි. 26.462 ක මුදලක් ආයතනය විසින් උපයන ලදි. මෙම උපයන ලද ආදායම් තුල කොරියානු වැඩ සටහන් වලින් උපයන ලද රු.මිලි. 8.66 ක් අන්තර්ගතවේ. වෙනත් ආයතන සඳහා අතුරුගිරිය මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම තුලින් රු.මිලි. 2.07 ක මුදලක් උපයන ලද (කොරියානු වැඩ සටහන් හැර) අතර බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම තුලින් රු.මිලි. 0.64 ක මුදලක් උපයන ලදි. බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය විසින් උපයන ලද ආදායම රු.මිලි. 3.796 කි.

බහුවිධ ප්‍රක්ෂේපණ, පරිගණක සහ පුස්තකාල පොත් මිලදී ගැනීම වැනි විවිධ උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලි. 0.908 ක් වැය කර ඇත. 2012 වසරේ වැය කරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු.මිලි. 8.112 කි. රු. 124,000/- ක අය කර ගත නොහැකි ණය ගැතියන් පාලක මණ්ඩලයේ අනුමැතිය යටතේ ආයතනයේ ගිණුම් පොත් වලින් ලියා හරින ලදි. මහා භාණ්ඩාගාරය විසින් රු.මිලි. 8.48 ක් සහ රු.මිලි.7.0 ක් පිළිවෙලින් පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ලබා දෙන ලදි. සමාලොචිත වර්ෂය තුල ක්ෂය සඳහා ප්‍රතිපාදන වන රු.මිලි. 9.725 ක මුදල හැර මුළු පුනරාවර්තන වියදම රු.මිලි. 39.804 කි. මුළු ආදායම රු.මිලි. 44.357 කි. එම නිසා වර්ෂයේ මුළු හිඟය රු.මිලි. 5.231 කි. කෙසේ නමුත් පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරය මත යැපීමේ ප්‍රතිශතය 21% ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. මෙය පසුගිය 2011 වසරට සාපේක්ෂව 84% ක අඩු වීමකි.

රු.මිලි. 4.865 ක් වැය කර තේ, පොල්, රබර්, උක් හා කජු කුඩා වතු හිමියන් සඳහා වැඩ සටහන් 188 ක් පවත්වන ලදි. ඒ සඳහා ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රධානය කරන ලදි. ප්‍රයෝජනයට ගත නොහැකි උපකරණ හා ද්‍රව්‍ය අපහරණය කිරීම තුලින් රු.මිලි. 0.064 ක් උපයා ගත්හ.

2013 වසරේ රු.මිලි. 13.7 ක් වැය කර ආයතනයේ අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියාව සහ කාර්යාල ගොඩනැගිලි පොදු වැසිකිලි හා සේවක නිල නිවාස 5 ක් අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් කර ඇත.

## 7. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රගතිය

2011 වසර හා සසඳන කල්හි පැවැත්වූ මුළු වැඩ සටහන් ප්‍රමාණය 104 සිට 249 දක්වා වැඩි වී ඇති හෙයින් ප්‍රතිෂ්ඨාපිතව එය පසුගිය වර්ෂවට සාපේක්ෂව 139.4% ක ඉහල යාමකි. 2010 වසරට සාපේක්ෂව 2011 වසරේ වැඩ සටහන් වැඩීමේ ප්‍රතිශතය 131% ක් වේ. පුහුණුවූවන්ගේ සංඛ්‍යාව, පුහුණු කල දින ගණන සහ උපයන ලද ආදායම සැලකිල්ලට ගැනීමේදී ඉතාමත් පැහැදිලි වැඩි වීමක් දැක ගැනීමට හැකිවේ. ආයතනයේ පුහුණු අංශයේ සේවක හිඟයක් පැවතියද බලාපොරොත්තුවූ වැඩ සටහන් ප්‍රමාණයෙන් 179% ක් දක්වා ප්‍රගතියක් ලඟා කර ගනිමට හැකිවිය. මෙය 2011 වසරේ දී 116% ක් විය. එසේ නමුත් පුහුණු අංශයේ සේවක සංඛ්‍යාව 2012 වසරේදිවත් වැඩි කර ගැනීමට නොහැකි වී ඇත.

ඉහත වැඩ සටහන් වලට අමතරව ආයතනය විසින් වැව්ලි කළමනාකරණය පිළිබඳ ජර්නල් දෙකක්ද (02) පුවත් ලිපි හතරක්(04) ද නිකුත් කරන ලදි. ඊට අමතරව ශ්‍රී ලංකා තේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන මණ්ඩලය අදියේ විවිධ තනතුරු සඳහා කාර්ය මණ්ඩල සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීම, උසස් කිරීම් සඳහා අදාල විභාග 11 ක් පවත්වන ලදි. මෙය පසුගිය වසරට සාපේක්ෂව 183.3% ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදි.

හත් දෙනෙකු සඳහා නව සාමාජිකත්වය ලබා දීම මඟින් මුළු වෘත්තිය සාමාජික සංඛ්‍යාව 238 දක්වා වැඩි කර ඇත. කෙසේ නමුත් අවශය කරන සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් දෙදෙනෙකුගේ අයදුම් පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු විය. අතුරුගිරිය පුස්තකාලයේ හා බගවන්තලාව කුඩා පුස්තකාලයේ වැව්ලි කළමනාකරණය පිළිබඳ විවිධ විෂයන් ඇතුලත් පොත් පිළිවෙලින් 6,000 ක් හා 600 ක් ඇත.

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ සේවක නිළ නිවාස සඳහා ජල සැපයුම සැපයීම සහ කොරියානු වැඩ සටහන් සඳහා භෝජන ශාලාවක් සෑදීම වෙනුවෙන් රු.මිලි. 1.65 ක් සමාලෝචිත වර්ෂය තුලදී වැය කරන ලදි. පුස්තකාල පොත් මිලදී ගැනීම සහ උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මිලි. 0.908 ක් වැය කරන ලදි. මෙය ආයතනයේ පුහුණුව ලබන්නන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අත්‍යාවශ්‍ය කරුණක් විය. ආයතනය විසින් 2011 වසරේදි රු.මිලි. 36.79 ක් ඉපයීමට හැකි විය. මෙය රු.මිලි. 44.357 ක් දක්වා වැඩි කිරීමට 2012 වසරේදී හැකි විය. එමඟින් 20.5% ක වැඩි වීමක් පෙන්නුම් කෙරේ. රු.මිලි. 8.66 ක් කොරියානු වැඩ සටහන් තුලින් උපයා ගැනීමට හැකිවූ අතර එය පසුගිය වසරේ රු.මිලි. 8.5 කි. සමාලෝචිත වර්ෂය තුලදී පුහුණු වැඩ සටහන් සඳහා සහභාගිවූවන්ගේ සංඛ්‍යාව විශාල ලෙස ඉහල ගිය අතර එය 10331 කි. එය පසුගිය වසරට සාපේක්ෂව 142% ක වැඩි වීමකි. මහා භාණ්ඩාගාරය විසින් නොමිලේ කුඩා වතු හිමියන් පුහුණු කිරීම සඳහා පාවිච්චි කිරීම වෙනුවෙන් ප්‍රථම වරට රු.මිලි. 5.0 ක් ලබා දුන්හ.කුඩා වතු හිමියන්ගේ දායකත්වය හා වැදගත්කම ඒත්තුගැන්වීමෙන් පසු සියළු වැව්ලි අංශයන් සඳහා වැඩ සටහන් 188 ක්

පැවැත්වීමට හැකි විය. 2013 වසරේදී මෙම මුදල රු.මිලි. 8.0 ක් දක්වා වැඩි කර ඇත. රටේ මුළු නිෂ්පාදනයෙන් පොදුවේ කුඩා වතු හිමියන් (තේ, රබර්, පොල්, උක්, තල් සහ කුරුඳු ආදිය) 75 % ක පමණ දායකත්වයක් දරනු ලබයි. එම නිසා වැඩි වශයෙන් කුඩා වතු හිමියන් සඳහා වැඩ සටහන් පැවැත්වීම තුලින් ඔවුන්ගේ හැකියා මට්ටම් වැඩි දියුණු කිරීම පොදුවේ පිලිගන්නා ලද කරුණකි. ආයතනය විසින් මෙම කාර්යය පිළිබඳ එකඟතාවය ඵල කරන අතර මුළු වැඩ සටහන් ප්‍රමාණයෙන් 75.5 % ක් මුළු සහභාගි වූවන්ගෙන් 79 % ක් ආවරණය වන පරිදි කුඩා වතු හිමියන් වෙනුවෙන් වැඩ සටහන් පැවැත්වීමට හැකි විය.

මේ අනුව 2011 වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු වැඩ සටහන් පැවැත්වීම, මුළු පුහුණු කල ප්‍රමාණය, පුහුණු දින ගණන සහ ඉපයූ ආදායම යනාදියේ අති විශාල ප්‍රගතියක් ලඟා කර ගැනීමට හැකි විය.

## 8.0 ආයතනය විසින් මුහුණ දුන් ගැටළු

2004 වසරේදී සිදුවූ ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලියේ බලපෑම හේතුවෙන් පෙර වර්ෂයන්හිදී පරිදි 2012 වසරේදී විවිධ ගැටළු වලට ආයතනයට මුහුණ දීමට සිදු විය.පුහුණු අංශ සේවක හිඟය මින් එකකි. පුහුණු අංශයෙහි කාර්ය මණ්ඩලය 05 දෙනෙකු පමණක් සේවය කරන ලදි. නම් වශයෙන් පුහුණු විශේෂඥ (කළමනාකරණ), පුහුණු විශේෂඥ (ගිණුම් හා මූල්‍ය පාලන), පුහුණු විශේෂඥ (කෘෂි ආර්ථික), පුහුණු නිළධාරි (කළමනාකරණ) සහ පුහුණු සහකාරවරයෙකු පමණි.මෙහි තනතුරු ගණනාවක් සඳහා ඇබෑර්තු පැවතියද 2012 වසරේදී බඳවා ගැනීමට අසීරු කරුණක් විය. කෙසේ නමුත් පුහුණු නිළධාරි (ගිණුම් හා මූල්‍ය පාලන) සහ නේවාසිකාගාර කළමනාකරු තනතුර සඳහා පුවත්පත් දැන්වීම් පල කර බඳවා ගැනීමට කටයුතු කලද මෙම තනතුරු සඳහා අයදුම්පත් එවන ලද කිසිදු පුද්ගලයෙකු මෙම තනතුර සඳහා සුදුසුකම් ලබා නොමැති වීම හෝ පලපුරුද්ද හෝ මේ දෙකම නොමැති වීම හේතුවෙන් තෝරා ගැනීමට නොහැකි විය. තුන්වන වරටත් ඉහත තනතුරු සඳහා දැන්වීම් පල කර අයදුම්පත් කැඳවූ අතර පුහුණු නිළධාරි (ගිණුම් හා මූල්‍ය පාලන) සඳහා එක් අයෙකු පමණක් සුදුසුකම් ලබා තිබේ. සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර වුවද දෙවරක් දැන්වීම් පල කිරීමෙන් පසු 2011 දෙසැම්බර් මාසයේදී තනතුර පුරවන ලදි. නේවාසිකාගාර කළමනාකරු තනතුර සඳහා තෝරාගත් අය සුදුසුකම් පරීක්ෂා කිරීමේ විභාගය සඳහා සහභාගී වී නැත.

බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි මෙම තනතුර සඳහා ඉහල සුදුසුකම් ඉල්ලා ඇති අතර අනෙක් අතට තෝරා ගනු ලබන පුද්ගලයන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද නොසලකා ආරම්භක වැටුප් පියවරෙහි තැබිය යුතුව ඇත. බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් මෙම කොන්දේසි හේතුවෙන් සුදුසු පුද්ගලයන් පුහුණු අංශය සඳහා බඳවා ගැනීම මහත් අසීරුතාවයක් බවට පත්වී ඇත.

අනෙකුත් වැවිලි පර්යේෂණ ආයතන සහ ඒ හා සමාන ආයතන සමඟ සසඳා බැලීමේදී ආයතනයේ අඩු වැටුප් හේතුවෙන් සුදුසු පුද්ගලයන් සමහරෙකු ඇබෑර්තු සඳහා අයදුම් කිරීමට අකමැති බව නිරීක්ෂණය විය.

සමහර වැවිලි සමාගම් ඔවුන්ගේ විධායක නිලධාරීන් අපගේ දීර්ඝ කාලීන අධ්‍යාපනික පාඨමාලා සඳහා සහභාගී කරවීමට මැලිකමක් දක්වන ලදි. මෙය ආයතනය මුහුණ දීමට සිදුවූ විශාල බාධකයන් ලෙස දැක්විය හැක. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විධායක නිලධාරීන් අඛන්ඩව පුහුණු වැඩ සටහන් වල දේශන සඳහා නිදහස් කිරීම හේතුවෙන් ඔවුන්ගේ නිෂ්පාදනය හා වතු වල පරිපාලන කාර්යයන් සඳහා බලපෑම් ඇතිවීමය. ඒ හේතුවෙන් ආයතනයේ අධ්‍යාපනික පාඨමාලා පැවැත්වීමේ ක්‍රමය නිරන්තරයෙන් වෙනස් කිරීමට සිදු විය. ආරම්භයේදී ඩිප්ලෝමා පාඨමාලා පූර්ණ කාලීනව මාස 04 ක් පැවැත්විය.නමුත් වතු වල කළමනාකාරිත්වය පුද්ගලිකරණය වීමෙන් පසු එය මසකට එක දිගට දින හයක් බැගින් පැවැත්වීම දක්වා වෙනස් විය. කෙසේ නමුදු මෙම ක්‍රමවේදයන් වෙනස් වීම් වලට ලක්වී වර්තමානයේදී සිකුරාදා දිනය සමඟ පළවන හා තුන්වන සති අන්තයන්හි කඩින් කඩ දින 6 ක් වන සේ මෙම පාඨමාලාව පවත්වනු ලැබේ. ආයතනය විසින් මුහුණ දීමට සිදුවූ මෙම ප්‍රධාන අපහසුතාවයන් හේතුවෙන් ඩිප්ලෝමා පාඨමාලා දුරස්ථ අධ්‍යාපනික ක්‍රමය දක්වා වෙනස් කිරීමට කටයුතු සිදු කරමින් පවති. ඒ අනුව 2013 වසරේ හතර වන කාර්තුවේදී මෙම ඩිප්ලෝමා පාඨමාලාව නව ක්‍රමවේදය යටතේ ආරම්භ කිරීමට හැකිවේ යැයි අපේක්ෂා කරයි.

අධ්‍යාපනික වැඩ සටහන් සඳහා සතියේ දින වලදී සහභාගී වීමට සමහර අයදුම්කරුවන් කැමැත්ත නොදක්වන අතර එවැනි වැඩ සටහන් සති අන්තයේදී පැවැත්වීමට ආයතනයට සිදු විය. අතිකාල වියදම් වැනි වියදම් මේ හේතුව නිසා බලාපොරොත්තු රහිතව වැඩි වී ඇත. තවද ආයතනයේ අභ්‍යන්තර සම්පත්දායකයින් සඳහා සති අන්තයන්හිදී ගෙවීම් රහිතව සේවය කිරීමට සිදු වි ඇත.

කෙසේ වුවද 75.5 % ක් පමණ වැඩ සටහන් කුඩා වතු හිමියන් සඳහා පැවැත්වන ලදි. ආයතනයේ මෙවැනි වැඩ සටහන් කුඩා වතු හිමියන් සිටින ප්‍රදේශ ආවරණය වන පරිදි පැවැත්වීමට කටයුතු යොදා තිබුණි. සමහර අවස්ථාවන්හිදී සම්පත්දායකයින් සහ අනෙකුත් සහය නිලධාරීන් සඳහා කිලෝමීටර් 400 කට වඩා ගමන් කිරීමට සිදු විය. එවැනි වැඩ සටහන් සඳහා කුඩා වතු හිමියන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙත පැමිණෙන්නේ නම් ඔවුන්ගේ දින දෙක තුනක ආදායම අහිමි වන බැවින් එලෙස පැමිණීමට ඔවුන් මැලිකමක් දක්වයි. මෙම වැඩ සටහන් කුඩා වතු හිමියන් සිටින ප්‍රදේශ වල පැවැත්වීම හේතුවෙන් අතිකාල දීමනා, ගමන් වියදම් සහ යැපුම් දීමනා ආදියෙහි යම් ඉහල යාමක් කෙරෙහි හේතුපාදක වී ඇත.

මූලික වශයෙන් අඩු දේශන දීමනාවන් ගෙවීම හේතුවෙන් පළපුරුදු උගත් සම්පත් දායකයින් ආයතනයේ සේවය සඳහා යොදා ගැනීමට අපහසු වීම තවත් බාධකයකි. වර්තමානයේ මෙම මුදල පැයකට රු. 1,000/- ක් වේ. අනෙකුත් ආයතන සමඟ සසඳීමේදී මෙය අඩු දේශන ගාස්තු දීමනාවකි. පාඨමාලා ගාස්තු තීරණය කිරීමේදී දේශන ගාස්තු සමඟ අනෙකුත් අදාල පිරිවැයන් සැලකිල්ලට ගනු ලබන අතර දේශන ගාස්තු ඉහල දැමුවහොත් එය පාඨමාලා ගාස්තුව ඉහල දැමීමට බලපානු ඇත. පාඨමාලා සඳහා සහභාගීවන්නන්ගේ ප්‍රමාණය සඳහා මෙමගින් බලපෑම් ඇති කල හැක. එසේ වුවහොත් පාඨමාලා ප්‍රමාණය සඳහා වු ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවේ. කෙසේ නමුදු ආයතනය සැලකිය යුතු ලෙස දේශන ගාස්තු ඉහල දැමීමට ලබන වර්ෂයේ කටයුතු යෙදීමට බලාපොරොත්තු වේ. මෙමඟින් බොහෝ දෙනාට ප්‍රිය වු සුදුසුකම් ලත් බාහිර සම්පත්දායකයින් ආයතනය වෙත ආකර්ශනය කර ගැනීමට බලාපොරොත්තුවේ.

වර්තමානයේදි ආයතනය සතු වාහන 06 ක් අවුරුදු 15 ක් ඉක්මවා ධාවනය කරන ලද ඒවාය. පෙජරෝ ජීප් රථය අවුරුදු 25 කට වඩා පැරණිය. කලින් සඳහන් කල පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශ වල කුඩා වතු හිමියන් වෙනුවෙන් වැඩ සටහන් පැවැත්වීම ඒ සඳහා සහභාගී වීමට මෙම පවතින වාහන නුසුදුසු තත්වයේ පවතී. ආයතනයේ සේවාදායකයින් හට කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික වීම සඳහා මෙම වාහන වලට නව වාහන හුවමාරු කිරීමක් සිදු කල යුතුය.

තවද ආයතනයේ පවතින ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ප්‍රවාහණය සඳහා දැනට පවතින වාහන සුදුසු තත්වයේ නොපවතී. එම උපකරන නියමිත පරිදි අසුරා ආරක්ෂිත ලෙස ප්‍රවාහනය නොකිරීමෙන් කැඩී බිඳී යා හැකිය. එම නිසා ජංගම පුහුණු ඒකකයන් සඳහා සුදුසු වාහනයක් මිලදී ගැනීමට අවශ්‍යවේ.

## 9.0 <u>නිගමන</u>

2004 වසරෙන් පසු ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය හේතුවෙන් ආයතනයට නොයෙකුත් බාධක හා අවහිරතා සඳහා මුහුණ දීමට සිදුවුවද ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන සමහර පාර්ශවයන්ගේ මැදිහත් වීම ආයතනය ක්‍රියාවිරහිත තත්වයේ පැවති කාල සීමාව තුල නේවාසික පුහුණු වැඩ සටහන් ස්ථාපිත කිරීමට හැකි විය. ඒ තුලින් පසුගිය 2011 වසරට සාපේක්ෂව ආයතනයේ මූල්‍යමය සහ භෞතික වශයෙන් ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ආයතනය අපේක්ෂා කල වැඩ සටහන් ප්‍රමාණය 139 ක් වුවද එය 249 ක් දක්වා වැඩි කර ගැනීමට හැකි විය. මෙය 179.1 % ක ප්‍රගතියක් අපේක්ෂා කල ප්‍රමාණය සමඟ සැසදීමේදී පෙන්නුම් කරයි. ආයතනය විසින් ඉමහත් ප්‍රචාරණයක් කළමනාකරණ සංවර්ධන සහ නිෂ්පාදනතාව හා තත්ත්ව සංවර්ධන වැඩ සටහන් සඳහා ලබා දුන්නද ආර්ථිකමය වශයෙන් ප්‍රමාණවත් ඉල්ලුමක් තවම මෙම වැඩ සටහන් සඳහා දක්නට නොලැබීය.

ආයතනයට සැහීමකට පත්වීමට කරුණක් වනුයේ කුඩා වතු හිමියන් සහ කම්කරුවන් සඳහා වැඩ සටහන් ප්‍රගතිය 254.1 % දක්වා වැඩි කර ගැනීමට හැකිවීමය. මෙම අගය කුඩා වතු හිමියන් හා කම්කරුවන් සඳහා වැඩ සටහන් වලට ඉහල ඉල්ලුමක් පවතින බව පෙන්නුම් කෙරේ.

කෙසේ වුවද කුඩා වතු හිමියන් හා වතු කම්කරුවන් සඳහා වඩ වඩාත් වැඩ සටහන් පැවැත්වීම කෙරේ හැකියාව පැවතියද පුහුණු අංශයේ සේවකයන්ගේ හිඟය මත මෙම වැඩ සටහන් කිරීමට හැකියාවක් නොමැති විය හැක.

සමාලෝචිත වර්ෂය තුලදී බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වැසිකිලි, මුළුතැන්ගෙය හා ආපන ශාලාව අළුත්වැඩියා කිරීමද, සේවක නිල නිවාස සහ ජල මණ්ඩලයේ ජල සැපයුම් ලබා දීමටද කොරියානු වැඩ සටහන් සඳහා ආපන ශාලා අවශ්‍ය පරිදි අළුත්නැඩියා කිරීමටද රු.මිලි. 1.65 ක් වැය කරන ලදී.

වර්ෂය තුල ආයතනයේ ආදායම් හා වියදම් අතර හිඟය රු.මිලි. 5.231 ක් පෙන්නුම් කලද මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපීම 21 % ක් දක්වා අඩු කර ගැනීමට ආයතනයට හැකි විය. මෙය විශාල ජයග්‍රහනයක් ලෙස සැලකිය හැකිය.

තවද තේ, රබර්, පොල්, උක් සහ කජු කුඩා වතු හිමියන් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගි කර ගෙන රු.මිලි. 4.865 ක් වැය කර වැඩ සටහන 188 ක් පැවැත්විය. 2013 වසරෙදි අවම වශයෙන් වැඩ සටහන් 253 ක් පැවැත්වීම සඳහා අපේක්ෂා කරනු ලැබේ. කුඩා වතු හිමියන් සහ වතු කම්කරුවන් පුහුණු වැඩ සටහන් වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කිරීමට එම වර්ෂයේදි ද බලාපොරොත්තුවේ. සමාලෝචිත වර්ෂයේදි ඉතිහාසයේ ප්‍රථම වරට නැගෙනහිර පලාතේ පුහුණු වැඩ සටහන් පැවැත්වීමට හැකි විය. ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල සහ අභ්‍යන්තර මාර්ග 2013 වසරේ අළුත්වැඩියා කිරීමට බලාපොරොත්තුවේ. මෙම තොරතුරු පදනම්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේදි මූල්‍ය සහ භෞතික ප්‍රගතිය පිලිබඳ සෑහීමකට පත්විය හැකි අතර 2013 වසරේදි ආයතනයේ සේවකයන්ගේ උත්සාහය හා පාලක මණ්ඩලයේ නිසි උපදෙස් මත සැලසුම් කල ඉලක්කයන් සපුරා ගැනීමට බලාපොරොත්තු වේ.

ආයතනයේ සභාපති වශයෙන් පාලක මණ්ඩලය වෙනුවෙන්ද කළමනාකාරිත්වය වෙනුවෙන්ද ආයතනයේ 2012 වර්ෂය තුල ක්‍රියාකාරකම් සාර්ථකව ඉටු කර ගැනිමට උපරිම සහයෝගය දැක්වූ සැම දෙනාහටම අවංක ස්තුතිය හා කෘතගුණ දැක්විමට මෙය අවස්ථාවක් කර ගනිමි.

සභාපති

රංජිත් සමරසිංහ

# මූල්‍ය වාර්තා

# පටුන

මූල්‍ය වාර්තා


| | පිටුව |
|---|---|
| 2012 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් | 01 - 09 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 10 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 11 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 12 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 13 |
| අයවැය සහ සත්‍ය කාර්ය සාධනය | 14 |
| දේපල පිරියත හා උපකරණ ලේඛනය | 15 |
| අස්පෘෂ්‍ය වත්කම් | 16 |
| 2012 වර්ෂය සඳහා ගිණුම් සටහන් | 17 - 27 |
| මූල්‍ය හා භෞතික ප්‍රගතියේ ඉස්මතු කිරීම | 28 |
| විගණකාධිපති වාර්තාව | 29 - 34 |

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**2012 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්**

## 01. මූලික ගිණුම්කරණ සංකල්ප

ආයතනයේ සියළු වගකීම් පියවීමට ප්‍රමාණවත් වනසේ අරමුදල් රජයේ ප්‍රදාන, පුහුණු වැඩසටහන් අධ්‍යාපනික පාඨමාලා, උපදේශකත්ව පැවරුම්, වෘත්තීය සාමාජිකත්ව දායක අරමුදල් සහ ප්‍රකාශන අලෙවියෙන් ලැබේ යැයි සැලකිල්ලට ගෙන ආයතනයේ පාලක මණ්ඩලයේ උපදෙස් මත අවිච්ඡින්න පැවැත්ම සංකල්පය මත පදනම්ව ගිණුම් සැකසීම සිදු කරයි.

## 02. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශයන්

ගිණුම් පිළියෙල කිරීමට අදාල මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් කර ඇත.

ගිණුම් වාර්තා පිළයෙල කිරීමට අදාල කර ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති විශේෂයෙන් සඳහන් නොකරන සෑම අවස්ථාවකදීම අඛණ්ඩව සියලුම ප්‍රකාශිත වර්ෂයන් සඳහා අදාල වේ.

**පිළියෙල කිරීමේ පදනම**

2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම සැලකිල්ලට ගෙන මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත. ඓතිහාසික පිරිවැයට වත්කම්හි ප්‍රත්‍යාගණනයන් ගැලපීමෙන් මූලික ගණනය අදාල කර ගෙන ඇත.

### 2.1.1 වැඩ, සේවා සහ සැපයුම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයන්ට අනුකූලව වැඩ, සේවා සහ සැපයුම් වලදී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ලබයි.

### 2.1.2 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගත් අස්පෘස්‍ය වත්කම්හි ගත් මිලෙහි සමුච්චිත ක්‍රමක්ෂය සහ අගයන් අඩු වීම, අඩු කර වාර්තා කරනු ලැබේ. ක්‍රමක්ෂය අය කරනු ලබන්නේ සරල මාර්ග පදනම මත වත්කමෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සැලකිල්ලට ගෙනය. සෑම වර්ෂයක්

අවසානයේදීම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්‍රමක්ෂය සමාලෝචනය කරනු ලබන අතර වත්කමෙහි වටිනාකම්හි වෙනස් වීමක් සිදු වුවහොත් එම වෙනස පිරික්සුම් කල අගය පදනම්ව ගිණුම්ගත කරනු ලැබේ.

<u>**දුරස්ථ ඉගනුම ඒකක සංවර්ධන පිරිවැය**</u>

ජාතික වැවිලි කළමනාකරණ ඩිපිලෝමා පාඨමාලාව සඳහා දුරස්ථ ඉගෙනුම් සංර්ධන පිරිවැය අස්පෘෂ්‍ය වත්කම් ලෙස සලකන අතර එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය අවු. හතරකට සීමා වේ.

<u>**කුඩා වතු හිමියන් සඳහා ශක්‍යතා වර්ධන වැඩ සටහන්**</u>

මෙම කුඩා වතු හිමියන් සඳහා පවත්වන වැඩ සටහන් ආයතනයට අස්පෘෂ්‍ය වත්කම් සේ සලකන අතර ඒ තුලින් ආයතනයේ කිර්තිභාවය වැඩි වීමට හේතු පාදක වී ඇත. කුඩා වතු හිමියන්ගේ ශක්‍යතාවයන් මේ තුලින් වර්ධනය වන අතර මේ තුලින් වැවිලි ක්ෂෙත්‍රයේ හා ආයතනයේ නිෂ්පාදනතාවය වැඩි දියුණු වීමට හේතු පාදක වේ.

මෙම පුහුණු වැඩ සටහන් ආයතනයේ ප්‍රාග්ධන ආයෝජනයන් වන අතර එහි බලපෑම වසර හතරක් තුල පවතී යැයි උපකල්පනය කර ඇත. මේ හේතුවෙන් ඒ සඳහා ආයෝජිත මුදල වැඩ සටහන පැවැත්වූ දින සිට ක්‍රමානුකූලව වසර හතරක් තුල පොත් වලින් ලියා හැරීම සිදු කරනු ලැබේ. අස්පෘෂ්‍ය වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

| **විස්තරය** | **ගිණුම්කරණ පරිගණක මුදුකාංගය** | **දුරස්ථ අධ්‍යාපන සංවර්ධන පාඨමාලා ගාස්තුව** | **කුඩා වතු හිමියන් සඳහා ශක්‍යතා වර්ධන වැඩ සටහන්** |
|---|---|---|---|
| ජීව කාලය | වසර 04 | වසර 04 | වසර 04 |

## 2.2 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයට සමුච්චිත ක්ෂය අඩුකර පෙන්නුම් කරයි. වත්කම ක්‍රියාකාරිතත්වයට ගෙන එන තෙක් වූ සෑම ඍජු පිරිවැයක්ම සහ සැලකිය යුතු අළුත්වැඩියාවන්ද මෙම ඓතිහාසික පිරිවැයට අන්තර්ගත කර ඇත.

### 2.2.1 ක්ෂය කිරීම

ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමය පදනම්ව ගණනය කරනු ලබන අතර ගිණුම් සඳහා ක්ෂය ඇස්තමේන්තුගත කරනු ලබන්නේ වත්කමේ ජිවිත කාලය සැලකිල්ලට ගෙන පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කිරීම මඟිනි.

පොදුවේ උපයෝගිකර ගනු ලැබූ ක්ෂය අනුපාතයන් පහත පරිදිවේ.

| | |
|---|---|
| නිදහස් ගොඩනැගිලි | 5% |
| කාර්යාලිය ලී බඩු | 10% |
| කාර්යාලිය උපකරණ | 20% |
| මෝටර් වාහන | 20% |
| යන්ත්‍ර හා පිරියත | 20% |
| මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකන | 10% |
| පුස්තකාල පොත් | 10% |
| විවිධ උපකරණ | 25% |
| ඉඩම් වැඩි දියුණු කිරීම් | 10% |

මාර්ග වැඩි දියුණු කිරීමේ පිරිවැය, කම්බි වැට සහ අනෙකුත් ඉඩම් වැඩි දියුණු කිරීම් ඉඩම් හා ඉඩම් සංවර්ධන පිරිවැයට ඇතුලත් වේ. එවැනි වැඩි දියුණු කිරීම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 10 කි.

මෝටර් වාහන හැර සියළුම ස්ථාවර වත්කම් පිරිවැය ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම් ගත කෙරේ.

### 2.2.2 අපහරණය කිරීම

අපහරණය කිරීමෙන් ලබන ලාභය හෝ පාඩුව නිර්ණය කරනු ලබන්නේ වත්කම් විකිණීමෙන් ලැබෙන මුදලෙන් වත්කම්හි රුගෙන එන වටිනාකම හා සැසදීමෙනි.මෙය ආදායම් වාර්තාවේ ඇතුලත් කරනු ලැබේ.

### 2.2.3 ප්‍රත්‍යාගණනය

අළුතින් මිලදී ගත් වාහන දෙක හැර ආයතනයේ සියළුම මෝටර් වාහන 2012 අගෝස්ත-23 වන දින වෘත්තිය වාහන තක්සේරු කරුවෙකු විසින් ප්‍රත්‍යාගණනය කරන ලදි. මෙමගින් ඇති වු ප්‍රත්‍යාගණන ලාභය ප්‍රත්‍යාගණන සංචිතය තුල ඇතුලත් කර ඇත. ප්‍රත්‍යාගණනය පිළිබඳ විස්තර පහත සඳහන්වේ.

තක්සේරුකරුගේ නම :- ඩී.බී.ඩී. සිල්වා මහතා
සුදුසුකම් :- වෘත්තිය වාහන තක්සේරුකරු
තක්සේරු කල දිනය :- 2012 අගොස්තු 23

| | | | | |
|---|---|---|---|---|
| තක්සේරු වටිනාකම | :- | 32-4086 ජීප් රථය | - | රු. 1,450,000/- |
| | | 61-2361 බස් රථය | - | රු. 950,000/- |
| | | 250-3161 කැබ් රථය | - | රු. 1,700,000/- |
| | | 58-3717කැබ් රථය | - | රු. 1,700,000/- |
| | | 250-2603 කැබ් රථය | - | රු. 1,550,000/- |
| | | 250-2604 වෑන් රථය | - | රු. 1,950,000/- |

### 2.2.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

වාර්ෂයක් අවසානයේ වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පවත්වා ආර්ථිකමය වශයෙන් පාවිච්චියට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා නිර්දේශ කැනු ලබයි.

## 03. යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඇති තැම්පතු

යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා සපයන ආයතනය වෙත ඉදිරිපත් කර ඇති තැම්පතු මෙයට ඇතුලත්වේ.

## 04. තොගයන්

ආයතනයේ ප්‍රකාශන, මුද්‍රණ උපකරණ, ලිපි ද්‍රව්‍ය, ටයර් සහ වෙනත් පාරිභෝගික ද්‍රව්‍යන් තොගයේ අන්තර්ගත වේ. මෙම තොග ගණනය කරනු ලබන්නේ ද්‍රව්‍ය මිල දී ගත් වටිනාකම අනුව ප්‍රථම මිල, ප්‍රථම නිකුතු මිල ක්‍රමය සැලකිල්ලට ගැනීමෙනි. තේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදානය කල පොත් ප්‍රකාශිත පොත් තොගයේ ඇතුලත් කර ඇත.

## 05. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දේ සඳහා මුදල් සහ බැංකු ජංගම ගිණුමේ ශේෂයන් ඇතුලත්ය.

## 06. කෙටි කාලින ආයෝජන

ආයතනය විසින් උපයන ලද අතිරේක ආදායම ආයතනයේ ඉදිරි සංවර්ධන වැඩ සටහන් සඳහා ප්‍රයෝජනයට ගැනීම සඳහා කෙටි කාලින ඉල්ලුම් තැම්පතු ස්ථාවර තැම්පතු සහ ඉතිරි කිරීමේ තැම්පතු ලෙස ලංකා බැංකුවේ අතුරුගිරිය ශාඛාවේ තැම්පත් කර ඇත.

## 07. සංචිතයන්

### 7.1 ප්‍රත්‍යාගණන සංචිතයන්

2012 වර්ෂයේ දි වාහන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට ඇතුලත් කර ඇත. ප්‍රත්‍යාගණනය කරන ලද වාහන විකිණීම හේතුවෙන් ඇති වන ලාභයන් ප්‍රත්‍යාගණන ගිණුමෙන් රඳවා ගත් ලාභ ගිණුමට මාරු කර ඇත.

## 08. සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

සේවයෙන් විශ්‍රාම යන සේවකයින් සඳහා ගෙවිය යුතු පාරිතෝෂිත දිමනා වෙන් කිරීම් මේ යටතේ අන්තර්ගත කර ඇත. ඉදිරි වර්ෂය තුලදී ගෙවිය යුතු පාරිතෝශිත ගෙවීම් ජංගම වගකිම් තුල මෙය ඇතුලත් කර ඇත.

## 09. විලම්භිත ආදායම

### 9.1 ප්‍රකාශන තොග පරිත්‍යාගයන්

තේ සංවර්ධන ව්‍යාපෘතිය මඟින් පරිත්‍යාග කරන ලද ප්‍රකාශන තොගයේ වටිනාකම විලම්භිත ආදායම් ගිණුමෙන් වර්ෂය තුල උපලබ්ධි වු ආදායම ප්‍රකාශිත වර්ෂයේ ආදායම් ලෙස ආදායම් විස්තරයට ඇතුලත් කරනු ලැබේ.

### 9.2 රජයේ ප්‍රාග්ධන ප්‍රදන

ප්‍රාග්ධන සංවර්ධන වියදම් සඳහා සැලකිය යුතු මුදලක් ජාතික අය වැය දෙපාර්තමේන්තුව මඟින් ප්‍රදනය කරන අතර මෙම මුදල විලම්භිත ආදායම් ගිණුමේ ඇතුලත් කර ඇත. වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට ගෙන තාර්කික පදනම යටතේ වාර්ෂිකව ක්ෂය වටිනාකම සැලකිල්ලට ගෙන ආදායම් වාර්තාවට ක්‍රමානුකූලව උපලබ්ධි කරනු ලබයි. වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත සඳහන් වේ.

| | |
|---|---|
| නිදහස් ගොඩනැගිලි | වසර 20 |
| කාර්යාලිය ලි බඩු | වසර 10 |
| කාර්යාලිය උපකරණ | වසර 05 |
| මෝටර් වාහන | වසර05 |

| | |
|---|---|
| යන්ත්‍ර හා පිරියත | වසර 05 |
| මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකතන | වසර 10 |
| පුස්තකාල පොත් | වසර 10 |
| විවිධ උපකරණ | වසර 04 |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | වසර 10 |

# 10. කෙටි කාලින වෙන් කිරීම් සහ අසම්භාව්‍යයන්

## 10.1 අසම්භාව්‍ය වගකීම්

ශ්‍රව්‍ය දෘෂ්‍ය නිළධාරී ලෙස ආයතනයේ සේවය කල ඒ.සී.කේ. අත්තනගොඩ මහතා විසින් විනය කරුණු හේතු කොට ගෙන තමාව සේවයෙන් පහ කිරීම පිළිබඳ නඩුවක් ගොනු කර ඇත. මෙම හේතුවෙන් ගිණුම් ප්‍රකාශිත වර්ෂය තුලදී රු. 508,071/- ක්වූ අසම්භාව්‍ය වගකීමක් ඔහුගේ වැටුප්, වේතන හා අනෙකුත් ගෙවීම් වෙනුවෙන් පැන නැගී ඇත. උසාවි තීරණය ගිණුම් සහතික කරන දින දක්වා ලැබී නොමැත. වර්ෂය අවසාන දිනට මුළු අසම්භාව්‍ය වත්කම් රු. 1,873,620.60 කි.

# 11. පුහුණු ආදායම

## 11.1 කෙටි කාලින වැඩ සටහන්

පුහුණු කාලසීමාව මාස 06කට වඩා අඩු නම් එම වැඩ සටහන කෙටි කාලින වැඩ සටහනක් ලෙස සලකනු ලැබේ. පුහුණු වැඩ සටහන ආරම්භක වර්ෂය තුල මෙම කෙටිකාලින පාඨමාලාවේ මුළු ආදායම, ආදායම් වාර්තාවට ඇතුලත් කරනු ලැබේ.

**11.2 දිගු කාලින පුහුණු වැඩ සටහන්** (පවත්වාගෙන යන පුහුණු වැඩ සටහන්)

පුහුණු කාල සිමාව මාස 06ට වඩා වැඩි වන්නේ නම් එම වැඩ සටහන් දිගු කාලින වැඩ සටහන් ලෙස සලකනු ලැබේ. මෙහි ආදායම් පුහුණු වැඩ සටහන් ආරම්භ කරන මාසය හා වැඩ සටහන් කාල සීමාව සැලකිල්ලට ගෙන සමානුපාතික පදනම උපයෝගි කර ගෙන ආදායම් හා වියදම් කාලින පදනම මත ගිණුම් ගත කෙරේ.

## 12. බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත.

## 13. ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීම

ආයතනයේ දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ ක්‍රමය හිනවන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ග ක්‍රමය දක්වා 2012 ජනවාරි 01 වන දින සිට වෙනස් කර ඇත. මේ හේතුවෙන් ඇතිවන ගැලපුම් අගයේ ප්‍රතිඵලය ගණනය කිරීම ප්‍රායෝගික කාර්යක් නොවේ. 2011 දෙසැම්බර් 31 දිනට පැවති රැගෙන එන වටිනාකම් පිරිවැය ලෙස සලකා නව ක්ෂය කිරීමේ පදනම (සරල මාර්ග) සඳහා උපයෝගි කරනු ලැබේ. මේ සඳහා නැවත සංශෝධිත ප්‍රයෝජනවත් ජීවිත කාලය අනුව වෙනස් වු නව සංශෝධිත අනුපාතයන් සැලකිල්ලට ගනී.පහත සඳහන් තොරතුරු ප්‍රමිතියේ අවශ්‍යතාවයන් මත හෙලිදරව් කරනු ලැබේ.

- ක්ෂය ගණනය පදනම හිනවන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ග ක්‍රමය දක්වා මාරු කර ඇත. සංශෝධිත ක්ෂය අනුපාතයන් පහත සඳහන් වේ.

| වත්කමේ ස්වභාවය | 2012.01.01 දිනට පෙර අනුපාතය | 2012.01.01 දිනට සංශෝධිත අනුපාතය | 2012.01.01 දිනට වත්කමේ පිරිවැය රු. |
|---|---|---|---|
| නිදහස් ගොඩනැගිලි | 5% | 5% | 41,961,425.87 |
| කාර්යාලීය ලී බඩු | 10% | 10% | 2,089,843.75 |
| කාර්යාලීය උපකරණ | 10% | 10% | 8,524,946.39 |
| මෝටර් වාහන | 20% | 20% | 17,233,806.22 |

| | | | |
|---|---|---|---|
| යන්ත්‍ර හා පිරියත | 10% | 10% | 504,113.04 |
| මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකතන | 10% | 10% | 230,025.78 |
| පුස්තකාල පොත් | 10% | 10% | 667,195.68 |
| විවිධ උපකරණ | 20% | 25% | 2,110,494.17 |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 20% | 10% | 3,090,722.94 |
| **එකතුව** | | | **76,412,573.84** |

- ක්ෂය ක්‍රමය වෙනස් කිරීම මඟින් වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල නිවරදි හා විස්වාසවන්ත තොරතුරු ලබා දීම සඳහා උපකාරී වේ.
- මෙම ගැලපීම මඟින් වර්තමාන කාල පරිච්ඡේදය හා ඊට පෙර වර්ෂ හා සංසංදනාත්මක තොරතුරු සැපයීම ප්‍රායෝගිකව ගණනය කල නොහැක. මේ හේතුවෙන් ගැලපිලි සඳහා පෙර වර්ෂ නැවත ප්‍රකාශ කිරීම් සඳහා නැවතත් තොරතුරු සපයාගැනීම ප්‍රායෝගිකව අසීරු කරුණකි.
- ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අවශ්‍ය පරිදි ගිණුම්කරණ ආකෘති වෙනස් කර ඇත.

**ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂයන්හි වෙනස් කිරීම්**

භාණ්ඩාගාරය විසින් මුල්‍යනය කරනු ලබන ප්‍රාග්ධන වියදම්, වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිතකාලය සැලකිල්ලට ගෙන ක්‍රමානුකුලව නැවත මුල්‍ය සාධන වාර්තාව වෙත ලියා හරිනු ලැබේ.

2010 වර්ෂයට පෙර ලද ප්‍රාග්ධන ප්‍රදානයන් ප්‍රමිත අනුව ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ස්කන්ධය හා ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශය නියමිත තොරතුරු සපයමින් නැවත ප්‍රකාශිත කරන ලදි.

පරණ වාහන උපලබ්ධි කිරීම තුලින් භාණ්ඩාගාරය වෙත මාරු කල මුදල (රු. 1,231,776/- ක මුදල) විලම්භිත ආදායම් ගිණුමෙන් අඩු කර නැවත ප්‍රකාශිත කරන ලදි.මේ අනුව විලම්භිත ආදායම් ගිණුමේ පහත සඳහන් පරිදි වෙනස් වීමට භාජනය විය.

| **වර්ෂය** | **ගිණුම් ශේෂය රු.** |
|---|---|
| 2010 දෙසැම්බර් 31 | 53,758,605.20 |
| 2011 දෙසැම්බර් 31 | 67,702,605.31 |
| 2012 දෙසැම්බර් 31 | 65,286,876.23 |

## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය
## මූල්‍ය තත්ව ප්‍රකාශනය

2012 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 31/12/2012 | නැවත ප්‍රකාශිත 31/12/2011 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 886,669.70 | 5,034,095.79 |
| ලැබිය යුතු දෑ | 2 | 5,081,305.49 | 3,637,661.62 |
| තොග | 3 | 884,003.26 | 863,355.90 |
| කලින් ගෙවීම් | 4 | 447,623.63 | 466,013.40 |
| වෙනත් ජංගම වත්කම් | 5 | 7,690,524.44 | 15,153,249.96 |
| | | **14,990,126.52** | **25,154,376.67** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | 6 | 1,437,876.97 | 989,006.62 |
| දේපල, පිරියත හා උපකරණ | 7 | 78,218,981.27 | 76,412,573.84 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 4,880,022.72 | 480,937.50 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 9 | 391,975.00 | 391,975.00 |
| | | **84,928,855.96** | 78,274,492.96 |
| **මුළු වත්කම්** | | **99,918,982.48** | **103,428,869.63** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු දෑ | 10 | 6,628,276.59 | 11,849,233.77 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 11 | 1,901,176.60 | 1,395,749.60 |
| සේවක ප්‍රතිලාභ | 12 | 1,118,662.87 | |
| | | **9,648,116.06** | **13,244,983.37** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| දිගු කාලීන ප්‍රතිපාදන | 13 | 65,286,876.23 | 67,702,665.31 |
| සේවක ප්‍රතිලාභ | 14 | 5,323,288.83 | 5,481,132.76 |
| | | **70,610,165.06** | **73,183,798.07** |
| **මුළු බැරකම්** | | **80,258,281.12** | **86,428,781.44** |
| **ශුද්ධ වත්කම්** | | **19,660,701.36** | **17,000,088.19** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| රජය දායක වු ප්‍රාග්ධනය හා වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායකත්වය | 15 | 38,386,495.21 | 38,386,495.21 |
| සංචිත | 16 | 7,833,012.66 | 2,751,220.37 |
| සමුච්චිත අතිරික්තය / (ඌණතාවය) | 17 | (26,558,806.51) | (24,137,627.39) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **19,660,701.36** | **17,000,088.19** |

පිටු අංක 01 සිට 09 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තින් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අත්‍යාවශ්‍ය කොටසක් වේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ (PED 54) අවශ්‍යතා අනුකූලව ගිණුම් සකස්කර ඇති බව අප විසින් සහතික කරමු.

එල්.ඩී.ජේ. ප්‍රියන්ත
ගණකාධිකාරී
28/02/2013

පී.ඩබ්ලිව්.ඒ. කපිලවංශ
අධ්‍යක්ෂ

ආර්.කේ. සමරසිංහ
සභාපති

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

**මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| **අයභාරය** | **සටහන්** | **31/12/2012 රු.** | **නැවත ප්‍රකාශිත 31/12/2011 රු.** |
|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 18 | 8,480,000.00 | 8,500,000.00 |
| රජයේ විලම්බිත ප්‍රාග්ධන ප්‍රදානමඟින් වු ආදායම්ඩ | 19 | 9,415,789.08 | 3,934,163.89 |
| පුහුණු ආදායම් | 20 | 13,731,102.43 | 9,647,640.08 |
| නේවාසික පහසුකම් කුලියට දීම තුලින් ලද ආදායම් | 21 | 7,559,446.08 | 7,951,989.00 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 22 | 3,796,837.61 | 3,970,322.00 |
| පොලී ආදායම් | 23 | 693,453.12 | 1,089,295.60 |
| වෙනත් ආදායම් | 24 | 680,663.87 | 1,705,182.78 |
| **මුළු අයභාරය** | | **44,357,292.19** | **36,798,593.35** |
| | | | |
| **වියදම්** | | | |
| සේවක වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 25 | 17,684,100.54 | 15,357,852.70 |
| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතය | 26 | 2,732,505.07 | 2,527,551.83 |
| නඩත්තු සහ අළුත්වැඩියා | 27 | 2,128,001.46 | 1,928,534.65 |
| සංනිවේදන සහ උපයෝගිතා සේවා | 28 | 5,289,807.69 | 4,264,438.89 |
| පුහුණු වියදම් | 29 | 6,425,816.69 | 6,138,065.30 |
| නේවාසික පහසුකම් කුලියට දීම සඳහා වු වියදම් | 30 | 2,561,533.42 | 1,033,088.72 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 31 | 2,037,215.78 | 2,162,615.00 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 32 | 9,725,102.81 | 3,946,538.89 |
| වෙනත් වියදම් | 33 | 945,608.22 | 687,778.13 |
| **මුළු වියදම්** | | **49,529,691.68** | **38,046,464.11** |
| අතිරික්තය / (ඌනතාවය) | | (5,172,399.49) | (1,247,870.76) |
| පාලන අස්ථිත්වයේ හිමිකරුට අදාල කොටස | | (5,172,399.49) | (1,247,870.76) |

## ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

*2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | | | | | |
|---|---|---|---|---|---|
| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිතය | අතිරික්ත සමුච්චිත/ (හිඟය) | එකතුව | **මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය** |
| 2009 දෙසැම්බර් 31 දිනට ශේෂය | 142,493,073.11 | 3,155,940.28 | (81,754,688.72) | 63,894,324.67 | 63,894,324.67 |
| 2010 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත විලම්භිත ආදායම් ගිණුමට මාරු කල ප්‍රමාණය | (104,106,577.90) | | | (104,106,577.90) | (104,106,577.90) |
| 2010 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත විලම්භිත ආදායම් ගිණුමෙන් මාරු කල ප්‍රමාණය (2010.01.01 දිනට පෙර ප්‍රාග්ධන ප්‍රදානයන්) | | | 53,679,477.26 | 53,679,477.26 | 53,679,477.26 |
| 2010 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත විලම්භිත ආදායම් ගිණුමෙන් මාරු කල ප්‍රමාණය (2010 වසරේ ප්‍රාග්ධන ප්‍රදානයන්) | | | 3,269,432.89 | 3,269,432.89 | 3,269,432.89 |
| 2010 වසර සඳහා අතිරික්තය | | | 1,511,302.03 | 1,511,302.03 | 1,511,302.03 |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **3,155,940.28** | **(23,294,476.54)** | **18,247,958.95** | **18,247,958.95** |
| 2011 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත විලම්භිත ආදායම් ගිණුමෙන් මාරු කල ප්‍රමාණය (2011 වසරේ ප්‍රාග්ධන ප්‍රදානයන්) | | | 3,113,837.37 | 3,113,837.37 | 3,113,837.37 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල ප්‍රමාණය 2011 | (1,231,776.00) | | | (1,231,776.00) | (1,231,776.00) |
| 2011 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත විලම්භිත ආදායම් ගිණුමට මාරු කල ප්‍රමාණය | 1,231,776.00 | | | 1,231,776.00 | 1,231,776.00 |
| රඳවා ගත් ලාභ ගිණුමට මාරුකල ප්‍රත්‍යාගනන | | (404,719.91) | 404,719.91 | - | - |
| අතිරික්තය/ (හිගය) 2011 වසර සඳහා | | | (4,361,708.13) | (4,361,708.13) | (4,361,708.13) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **2,751,220.37** | **(24,137,627.39)** | **17,000,088.19** | **17,000,088.19** |
| රඳවා ගත් ලාභ ගිණුමට මාරුකල ප්‍රත්‍යාගනන | | (2,751,220.37) | 2,751,220.37 | - | - |
| වත්කම් ප්‍රත්‍යාගණන ලාභය | | 7,833,012.66 | | 7,833,012.66 | 7,833,012.66 |
| අතිරික්තය/ (හිගය) 2012 වසර සඳහා | | | (5,172,399.49) | (5,172,399.49) | (5,172,399.49) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **7,833,012.66** | **(26,558,806.51)** | **19,660,701.36** | **19,660,701.36** |
| | | | | | |

| | | |
|---|---|---|
| **ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**<br>මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
| *2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | | |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සිදුවූ මුදල් ප්‍රවාහයන්*** | 31/12/2012 | නැවත ප්‍රකාශිත 31/12/2011 |
| | රු. | රු. |
| **වර්ෂය සඳහා අතිරික්තය (හිඟය)** | (5,172,399.49) | (4,361,708.13) |
| ***මුදල් නොවන සංචලනයන්*** | | |
| ක්ෂය (සටහන 02) | 9,025,714.49 | 3,934,163.89 |
| ක්‍රමක්ෂය | 699,388.32 | 12,375.00 |
| විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 960,818.94 | 602,823.21 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම් | (64,112.51) | (1,192,926.93) |
| විලම්බිත ආදායම් | (9,415,789.08) | (820,326.52) |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ හි (වැඩිවීම්) / අඩුවීම් | (1,443,643.87) | 1,140,390.18 |
| තොගයන් හි (වැඩිවීම්) / අඩුවීම් | (20,647.36) | (12,013.08) |
| කලින් ගෙවුම් හි (වැඩිවීම්) / අඩුවීම් | 18,389.77 | |
| අනෙකුත් ජංගම වත්කම් හි (වැඩිවීම්) / අඩුවීම් | 7,462,725.52 | 5,351,194.35 |
| දිර්ඝ කාලින ලැබිය යුතු දෑ හි (වැඩිවීම්) / අඩුවීම් | (448,870.35) | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම් / (අඩුවීම්) | (5,220,957.18) | 4,986,722.43 |
| කෙටි කාලින වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්) | 505,427.00 | 468,903.60 |
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ ප්‍රවාහය*** | (3,113,955.80) | 10,109,598.00 |
| ***ආයෝජන ක්‍රියාකාරකම්*** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනිම | (3,014,590.75) | (24,658,393.97) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනිම | (5,098,473.54) | (450,000.00) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් ලැබීම් | 79,594.00 | 1,262,833.00 |
| ***ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය*** | (8,033,470.29) | (23,845,560.97) |
| ***මූල්‍ය ක්‍රියාකාරකම්*** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් | 7,000,000.00 | 10,010,000.00 |
| වෑන් රථයක් සඳහා රජයේ ප්‍රදානයන් | | 9,100,000.00 |
| මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවීම් | | (1,231,776.00) |
| ***මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය*** | 7,000,000.00 | 17,878,224.00 |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)*** | (4,147,426.09) | 4,142,261.03 |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ හි වාර්ෂික ආරම්භක ශේෂය*** | 5,034,095.79 | 891,834.76 |
| | | |
| ***මුදල් හා මුදල් සමාන දෑ හි වාර්ෂික අවසාන ශේෂය*** | 886,669.70 | 5,034,095.79 |
| | | |

## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය
## අයවැය සහ සත්‍ය කාර්ය සාධනය
2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| *ආදායම* | | *සත්‍ය* | *අයවැය* |
|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 18 | 8,480,000.00 | 9,800,000.00 |
| විලම්භිත ආදායම් වෙනුවෙන් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 19 | 9,415,789.08 | 2,347,070.00 |
| පුහුණු ආදායම් | 20 | 13,731,102.43 | 16,070,000.00 |
| නේවාසික පහසුකම් කුලියට දීම | 21 | 7,559,446.08 | 10,000,000.00 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 22 | 3,796,837.61 | 8,750,000.00 |
| පොලී ආදායම් | 23 | 693,453.12 | 700,000.00 |
| වෙනත් ආදායම් | 24 | 680,663.87 | 770,000.00 |
| ***මුළු ආදායම්*** | | 44,357,292.19 | 48,437,070.00 |
| | | | |
| ***පුනරාවර්තන වියදම්*** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 25 | 17,684,100.54 | 19,086,000.00 |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන් | 26 | 2,732,505.07 | 2,975,000.00 |
| නඩත්තු සහ අලුත්වැඩියා | 27 | 2,128,001.46 | 2,455,000.00 |
| සංනිවේදන සහ උපයෝගිතා සේවා | 28 | 5,289,807.69 | 5,305,000.00 |
| පුහුණු වියදම් | 29 | 6,425,816.69 | 5,550,000.00 |
| පහසුකම් කුලියට දීම සම්බන්ධ වියදම් | 30 | 2,561,533.42 | 3,540,000.00 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 31 | 2,037,215.78 | 2,410,000.00 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 32 | 9,725,102.81 | 7,999,000.00 |
| වෙනත් වියදම් | 33 | 945,608.22 | 1,099,000.00 |
| **මුළු වියදම්** | | 49,529,691.68 | 50,419,000.00 |
| | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| ස්ථාවර වත්කම් | | 3,014,190.00 | 15,970,000.00 |
| අස්පෘෂ්‍ය වත්කම් | | 5,097,973.54 | 6,600,000.00 |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | | 8,112,163.54 | 22,570,000.00 |

| | | | |
|---|---|---|---|
| **මුළු වියදම්** | | 57,641,855.22 | 72,989,000.00 |
| භාන්ඩාගාර ප්‍රදාන | | | |
| පුනරාවර්තන වියදම් | | 8,480,000.00 | 9,800,000.00 |
| ප්‍රාග්ධන වියදම් | | 7,000,000.00 | 13,650,000.00 |
| **මුළු ප්‍රදාන** | | 15,480,000.00 | 23,450,000.00 |

## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

### දේපල පිරියත හා උපකරණ ලේඛනය

| විස්තරය | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | ගොඩනැගිලි | යන්ත්‍ර හා තපිරිය | උපකරණ | ලී බඩු | මෝටර් වාහන | මාර්ග, ජල සැපයුම්, විදුලිය හා දුරකථන | පුස්තකාල පොත් | විවිධ උපකරණ | එකතුව |
